# සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය
# ශ්‍රී ලංකාව

(සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය යටතේ 1984 මැයි මාසයේ සිට 1985 අප්‍රියෙල් මාසය දක්වා ක්‍රියාත්මකවූ පුහුණු පාඨමාලා සහ ක්‍රියාකාරකම් අලලා සකස් විය).

වාර ප්‍රකාශන මාලා 18

1986 පෙබරවාරි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114, විජේරාම මාවත, කොළඹ 7.

2009/06
2010/04.

# සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය

## ශ්‍රී ලංකාව

(සුළුගොවි සංවිධාන ව්‍යාපෘතිය යටතේ 1984 මැයි මාසයේ සිට 1985 අප්‍රේල් මාසය දක්වා ක්‍රියාත්මක වූ පුහුණු පාඨමාලා සහ ක්‍රියාකාරකම් අළලා සකස් විය)

රංජිත් කුමාරසිරි පතිරණ

වාර ප්‍රකාශන මාලා 18 1986 පෙබරවාරි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
114 විජේරාම මාවත
කොළඹ 7.

22259

22259

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 62% ක් පමණ දෙනා සුළුගොවීන් වශයෙන් යැපුම් මට්ටමේ හෝ ඊට පහළ මට්ටමක ජීවත් වෙති. අක්කර 03 කට වඩා අඩු ඉඩම් අයිති ගොවීන් හා අඳ ගොවීන් සුළු ගොවීන් වශයෙන් හැඳින්විය හැක. ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනයේදී ජනගහණයෙන් වැඩිදෙනා වන මේ පිරිසගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට යම් ප්‍රයත්නයක් සැකසීම කාලෝචිත වේ.

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අනුග්‍රහය ඇතිව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සුළු ගොවීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ උපාය මාර්ගයක් වශයෙන් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. නියමු ව්‍යාපෘතියෙන් ලත් ඵල ප්‍රයෝජන හා අත්දැකීම් ආශ්‍රය කරගෙන අද මෙම ව්‍යාපෘතිය මුළු කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාත් අනික් සෑම දිස්ත්‍රික්කයකම එක් ගොවිජන සේවා ප්‍රදේශය බැගින් තෝරා ගෙන ගොවි සංවිධාන පිහිටුවා ඇත. මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ලංකාවේ ඒ ඒ දිස්ත්‍රික්කවල ගොවි සංවිධාන පිහිටුවීමේ කටයුතු කරගෙන යනු ලැබේ.

මෙම සුළුගොවි සංවිධාන ව්‍යාපෘතිය 1984 මැයි මාසයේ සිට 1985 අප්‍රේල් මාසය දක්වා ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථ, කාර්ය සංසිද්ධීන්, ඵල-ප්‍රයෝජන, අත්දැකීම් හා ගැටළු පිළිබඳව විමසුමක යෙදීම මෙම කෘතියෙහි අරමුණ වේ. මෙම කෘතිය ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි රංජිත් කුමාරසිරි පතිරණ මහතා විසින් සකසන ලදී. ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය කෙරෙහි මෙන්ම සුළුගොවි සංවිධාන ව්‍යාපෘතිය කෙරෙහි උනන්දුවක් දක්වන්නන් හට මෙම කෘතිය වැදගත් වේ යයි විශ්වාස කරමි.

ටී.බී. සුබසිංහ
අධ්‍යක්ෂ.

# ස්තූතිය.

මෙම නිබන්ධනය ශ්‍රී ලංකාවේ සුප්‍රගොවි සංවිධාන ව්‍යාපෘතිය යටතේ 1984 මැයි මාසයේ සිට 1985 අප්‍රේල් මාසය දක්වා ක්‍රියාත්මක වූ පුහුණු පාඨමාලා සහ ක්‍රියාකාරකම් අලලා සකස් කරන ලද්දකි.

මෙම නිබන්ධනයේ මුල් පිටපත සකස් කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධ විවේචනාත්මක ඇගයීමක් කල ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ටී.බී. සුබසිංහ මහතාට සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ජයන්ත පෙරේරා මහතාට මගේ ස්තූතිය හිමිවේ.

අනතුරුව මුල් පිටපත සංස්කරණය කල ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ ජලපාලන පර්යේෂණ තොරතුරු මධ්‍යස්ථානයේ සංස්කාරක එච්.ඩී. කරුණාරත්න මහතාට මගේ ස්තූතිය හිමි වේ.

මෙම නිබන්ධනය සකස් කිරීමේ කාර්යාවලියේදී නන් අයුරින් මට සහාය වූ මෙම ආයතනයේ සංඛ්‍යාන සහකාර එන්.එස්.බී. ඇපාකන්ද මහතාට මා ස්තූති කරමි.

අවසාන වශයෙන් මෙම නිබන්ධනය යතුරු ලේඛනය කරදුන් ආයතනයේ යතුරු ලේඛිකාවන්ටත්, මනාව මෙහි මුද්‍රණ කටයුතු සිදුකල මුද්‍රණ අංශයේ සියළුම සේවක මහත්-වරුන්ටත් මගේ ස්තූතිය හිමිවේ.


රංජිත් කුමාරසිරි පතිරණ
වාරි ජලපාලන සහ ගොවිජන සම්බන්ධතා අංශය.

පර්යේෂණ හා පුහුණුකිරීමේ කණ්ඩායම.

| | | |
|---|---|---|
| ප්‍රධාන උපදේශක | : | ටී.බී. සුබසිංහ මහතා, අධ්‍යක්ෂ<br>ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය. |
| සම්බන්ධීකරණය | : | ආචාර්ය ජයන්ත පෙරේරා, නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.<br><br>පී.ඩී.ආර්. කුමාරසිරි මහතා<br>පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී<br>ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.<br><br>හරිප්‍රියා කරුණාරත්න මහත්මිය<br>පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරිනී<br>ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.<br><br>විමල් අත්තුඩාවගේ මහතා, සහකාර කොමසාරිස්<br>ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල. |
| විදේශීය උපදේශක | : | ජේ.පී. ජෝසි මහතා<br>ග්‍රාමීය සංවර්ධන<br>විශේෂඥ - ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| සංඛ්‍යාලේඛන කටයුතු | : | එන්.එස්.බී. ඇපාකන්ද මහතා<br>සංඛ්‍යාන සහකාර<br>ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය. |
| සංවිධාන කටයුතු | : | ජේ.ජේ.ඩී.එන්. ගුණතිලක මහතා<br>ස්ථානභාර නිලධාරී<br>ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ,<br>ප්‍රාදේශීය පුහුණුකිරීමේ මධ්‍යස්ථානය. |

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | පිටු අංක |
| 1 වන පරිච්ඡේදය | 1 - 3 |
| 2 වන පරිච්ඡේදය | 4 - 9 |
| 3 වන පරිච්ඡේදය | 10 - 25 |
| 4 වන පරිච්ඡේදය | 26 - 34 |
| සමාලෝචනය | |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කම්ටු පදනම යටතේ ගොවි සංවිධාන ව්‍යාප්තිය | 35 - 36 |
| සිතියම (කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන ව්‍යාප්තිය) | |
| ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් පදනම යටතේ ගොවි සංවිධාන ව්‍යාප්තිය | 37 |
| සිතියම (ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් පදනම යටතේ ගොවි සංවිධාන ව්‍යාප්තිය) | |

# හැඳින්වීම

1980 ජූලි මාසයේ දී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් නියාමක සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියක් ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙහි ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙහිලා උපදේශකත්ව මට්ටමින් අනුග්‍රහය ලැබුනේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙනි. එම සංවිධානය විසින් බංගලිදේශික නූර් හක් මහතා ව්‍යාපෘතියේ උපදේශක වශයෙන් පත්කර එවන ලදී. එම මහතාගේ උපදේශකත්වය මත ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙහි තෝරාගත් ගොවි නියෝජිත මහතුන් 44 දෙනෙකු වෙත මෙම සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. එක් දින පාඨමාලාවක් සඳහා එම ගොවි නියෝජිත මහතුන් ගල්ගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට කැඳවා ගම් මට්ටමින් හෝ යාය මට්ටමින් ගොවීන් සංවිධානය වීමේ වැදගත්කම අවබෝධ කර දෙන ලදී.

එසේ පුහුණු වූ ගොවි නියෝජිත මහතුන් විසින් තම තමන්ගේ ගම් ප්‍රදේශවල යාය මට්ටමින් ගොවි සංවිධාන ආරම්භ කරන ලදී. ඒ ඒ ප්‍රදේශයේ ගොවි නියෝජිතයා, සුළුගොවි සංවිධානයේ ලේකම් තනතුර හා භාණ්ඩාගාරික තනතුර දරනු ලැබීම කැපී පෙනෙන ලක්ෂණයකි. එවැනි පත් කිරීමක දී පදනම් වූ විශේෂ හේතුව වූයේ ගොවි නියෝජිතයා ගොවිජන සේවා කමිටුව හා දක්වන සම්බන්ධතාවයයි. 1980 සිට 1983 අතර කාලය තුළ මෙම නියාමක ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වූ අතර එමගින් ගොවීන් ලබාගත් ප්‍රතිඵල රාශියකි. ගොවීන් කණ්ඩායමක් වශයෙන් කෘෂිකාර්මික ණය ලබාගැනීම, ජලපාලනය කිරීම, සංවිධාන සහයෝගය මත වාරිකර්මාන්ත පිළිසකර කරගැනීම, කෘෂි අස්වැන්න දියුණු කරගැනීම හා කණ්ඩායම් ඉතුරුම් ආරම්භ කිරීම ඉන් කිහිපයකි.

මෙම නියාමක ව්‍යාපෘතිය මාර්ගයෙන් ආරම්භ කල ගොවි සංවිධාන 44 අවුරුදු 03 ක පමණ කාලයක් තුළ ලබාගත් ප්‍රතිඵල, අත්දැකීම් හා මුහුණ දුන් ගැටළු ආශ්‍රය කරගෙන මෙම ව්‍යාපෘතියේ දෙවන පියවර ආරම්භ කරන ලදී. එනම් ගල්ගමුව ඡන්ද කොට්ඨාශය පුරා සුළු ගොවි සංවිධාන පිහිටුවීමයි. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් 1983 ජූනි මාසයේ දී තෝරාගත් ප්‍රදේශවල ගොවීන් හා කෘෂි ක්ෂේත්‍රයට අදාල නිලධාරීන් දින 03 ක පුහුණුවක් සඳහා කැඳවන ලදී. එම ප්‍රදේශ නම් ගල්ගමුව ඡන්ද කොට්ඨාශයට අයත් රාජාංගනය, මහානාන්නේරිය, ඇහැටුවැව සහ මොරගොල්ලාගම යන ගොවිජන සේවා කමිටු හතරට අයත් ප්‍රදේශයන්ය. එම ගොවිජන සේවා කමිටු ප්‍රදේශවල කෘෂිකර්මාන්තයේ නියැලී සිටින තෝරා ගත් ගොවි නියෝජිත මහතුන් මෙන්ම වගා නිලධාරීන් ද ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරීන් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක මහතුන් ද කෘෂි ව්‍යාප්ති සේවක මහතුන් ද ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ක්ෂේත්‍ර සංවර්ධන නිලධාරීන් ද මෙම පුහුණුව ලැබූ පිරිස අතර වූහ. ගොවීන් මෙන්ම ක්ෂේත්‍ර නිලධාරීන් ද එකම වහලක් යටදී මෙසේ පුහුණුව ලබා තම තමන්ගේ ගොවිජන සේවා කමිටු ප්‍රදේශවල ගොවි සංවිධාන ආරම්භ කිරීමේ කාර්යභාරය ඉදිරියට ගෙනයන ලදී. මෙපරිද්දෙන් එම ගොවිජන සේවා කමිටු ප්‍රදේශ හතර තුළ 1983 වන විට සුළු ගොවි සංවිධාන 123 ක් පිහිටුවා තිබීණ.

1984 මැයි මාසයේ දී ව්‍යාපෘතියේ තුන්වන අදියර ආරම්භ කරන ලදී. තුන්වන පියවරෙහි මූලික ඉලක්කය වූයේ කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීමයි. මේ සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් උපදේශකත්ව මට්ටමින් ද පුහුණුකිරීමේ කටයුතු සඳහා මූල්‍යමය වශයෙන් ද ආධාර සපයන ලදී. 1984 මැයි මාසයේ දී ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් නේපාල් ජාතික ජේ.පී. ජෝෂි මහතා උපදේශකයෙකු වශයෙන් ලංකාවට එවන ලදී. ඒ මහතාගේ උපදේශකත්වය යටතේ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ පුහුණුකිරීමේ කණ්ඩායම විසින් මෙම ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාත් ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වෙතත් ව්‍යාප්ත කිරීමේ කටයුතු බොහොමයක් දැනටමත් අවසන් කරනු ලැබ ඇත.

මෙම වාර්තාවේ මූලික අරමුණ වන්නේ සුළු ගොවි ව්‍යාපෘතියේ තුන්වන අදියරේ දී ලබාගත් ප්‍රතිඵල, අත්දැකීම් හා මුහුණදුන් ගැටළු පිළිබඳව විමර්ශනය කිරීමයි. ප්‍රධාන පරිච්ඡේද හතරක් යටතේ ඒ සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමි. පළමු පරිච්ඡේදයේ දී ව්‍යාපෘතිය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තෝරාගැනීම සම්බන්ධ ක්‍රම විද්‍යාත්මක එළඹුම සාකච්ඡා කෙරේ. දෙවන පරිච්ඡේදයේ දී ව්‍යාපෘතියේ වැදගත්කම හා පරමාර්ථ පැහැදිලි කෙරෙන අතර ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියෙහි දී සුළු ගොවි සංවිධානයන්හි වැදගත්කම සාකච්ඡා කෙරේ. තුන්වන පරිච්ඡේදය මගින් ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කිරීම සඳහා ගත් ව්‍යායාමය පැහැදිලි කෙරෙන අතර ඒ සම්බන්ධයෙන් පැවැත්වූ පුහුණුකිරීමේ පාඨමාලා සහ සාකච්ඡා කළ කරුණු අඩංගු කෙරේ. අවසාන පරිච්ඡේදයේ දී ව්‍යාපෘතියේ ප්‍රතිඵල, ලැබූ අත්දැකීම් සහ මුහුණපෑ ගැටළු සාකච්ඡාවට භාජනය කෙරෙන අතර ව්‍යාපෘතියේ අනාගතය සම්බන්ධයෙන් යෝජනා කළහැකි අදහස් කිහිපයක් ද විමර්ශනය කරනු ලැබේ.

## 1 වන පරිච්ඡේදය

ඕනෑම ආකාරයක පරීක්ෂණයක් හෝ පුහුණුකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේදී එම ව්‍යාපෘතිය කෙරෙහි බලපාන භෞතික සාධක මෙන්ම මානව විද්‍යාත්මක සාධක ගැන අවධානය යොමු කිරීම එම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමෙහිලා ප්‍රයෝජනවත් වේ. ශ්‍රී ලංකාවේ සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය මුල්කොට ගෙන ආරම්භ කිරීමේදී ද බලපෑ විශේෂ සාධක ප්‍රථමයෙන්ම සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

කුරුණෑගල දිස්ත්‍රික්කය භෞතික වශයෙන් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයට වයඹ දෙසින් කඳු මෙන්ම තැනිතලා ප්‍රදේශ වලින් ගහණ ප්‍රදේශයක් වශා සිටී. කුරුණෑගල දිස්ත්‍රික්කයට ලංකාවේ ප්‍රධාන වැසි ලැබෙන සියළුම ආකාරවලින් වැසි ලැබේ. එනම් නිරිතදිග මෝසම් සුළං ඊසානදිග මෝසම් සුළං හා වාසුලි මගින් මෙම දිස්ත්‍රික්කයට වර්ෂා ජලය ලැබේ. මේ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය තුල ඉතාම වියලි දේශගුණික පරිසරයක් ද තෙත් කලාපයට ඉතා සමීප දේශගුණික සාධක ද දක්නට ලැබේ.

මෙම තෙත් කලාපීය හා වියලි කලාපීය දේශගුණික තත්ත්වයන් අතර අන්තර් කලාපීය දේශගුණික ලක්ෂණ දක්නට ලැබෙන ප්‍රදේශ ද බොහොමයකි. මේ තත්ත්වය හේතුකොටගෙන මිනිසුන්ගේ ආර්ථික කටයුතුවල කැපී පෙනෙන ලක්ෂණ බොහොමයක්ම හඳුනාගත හැක. උදාහරණ වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ගල්ගමුව හෝ නිකවැරටිය ප්‍රදේශයෙහි ප්‍රධාන වශයෙන් වී වගාව සිදු කරනු ලබන්නේ මහා වාරිමාර්ග යටතේය. එහෙත් කෑගල්ල දිස්ත්‍රික්කයට සමීප පොල්ගහවෙල වැනි ප්‍රදේශයක මූලික වශයෙන් වී වගා ව්‍යාප්තිය සිදුවී ඇත්තේ වර්ෂා ජලය මුල්කරගෙන ය. මෙම ප්‍රදේශ දෙක අතර දක්නට ලැබෙන ක්‍රාන්ති කලාපය තුල බොහෝ විට කෘෂිකාර්මික කටයුතු සිදු කරනු ලබන්නේ සුළු වාරිමාර්ග පදනම් කරගෙන ය. විශේෂයෙන් කුඩා වැව් අමුණ මෙහිදි කැපී පෙනෙන අතර ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් කුඩා වැව් ඉතා විශාල ප්‍රමාණයක් ඇත්තේ ද කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ය. මෙසේ මහා වාරිමාර්ග ක්‍රම, සුළු වාරිමාර්ග ක්‍රම හා වර්ෂා ජලය මුල් කරගෙන කෘෂිකාර්මික කටයුතු කිරීම නිසා වගා ව්‍යාප්ති රටාවන්හිදී කැපී පෙනෙන වෙනස්කම් රාශියක් දිස්ත්‍රික්කය පුරා දක්නට ඇත. මුං, කව්පි වැනි ධාන්‍ය වර්ග සඳහා නිකවැරටිය සහ ගල්ගමුව ආදි ප්‍රදේශ කැපී පෙනෙන අතර තෙත් කලාපීය වගාවන් වන කොකෝවා මෙන්ම තේ වගාව සඳහා දොඩන්ගස්ලන්ද වැනි ප්‍රදේශ ප්‍රසිද්ධය. මීට අමතරව කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ පොල් වගා ත්‍රිකෝණයට මුළුමනින්ම අයත් වේ.

මෙවැනි දේශගුණික හා භෞතික පරිසරයක් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය සඳහා අතිශයින්ම වැදගත්වන බව මෙහිදි මතක් කිරීමට කැමැත්තෙමි. සුළු ගොවියා යනු කවරෙක්ද යනු මෙම ග්‍රන්ථයෙහි වෙනත් තැනක නිර්වචනය කර ඇති අතර මෙහිලා ඉතා සරල වශයෙන් "සුළු ගොවියා යනු කවරෙක්ද" යි හැඳින්වීමේදී, ඔහු අක්කර 03 කට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳින්නෙකු වශයෙන් හැඳින්විය හැක. එසේ නම් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 80% කට වඩා ජීවත් වන්නේ සුළු ගොවීන් යයි පෙන්වා දිය හැකිය.

කුරුණෑගල දිස්ත්‍රික්කයට ආවේණික කෘෂිකාර්මික ප්‍රශ්නවල සවරූපය මෙම දිස්ත්‍රික්කය මෙම ව්‍යාපෘතිය සඳහා තෝරාගැනීමේ දී අතිශයින්ම වැදගත් විය. ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වලට සුවිශේෂ වූ බොහෝ කෘෂිකාර්මික ප්‍රශ්නවල සම්මිශ්‍රණයක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දක්නට පුළුවන. විශේෂයෙන් කෘෂිකාර්මික ණය භාවිතයේදී ගොවීන්ට මුහුණපෑමට වන දුෂ්කරතා පැරණි ණය ගෙවා ගැනීමට ඇති දුෂ්කරතා, දුගීකම, විරැකියාව, වාරිමාර්ග ගැටළු, වගා පාලුවීම්, අස්වනු හීනවීම, ඉඩම් සම්බන්ධ නීත්‍යානුකූල අයිතියක් නැතිකම ආදී ගැටළු රාශියක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දක්නට ඇත. මේ අනුව ග්‍රාමීය සංවර්ධන ඉලක්ක කරගත් සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය මුල්කරගෙන ආරම්භ කිරීම වැදගත් වෙයි. මෙම ව්‍යාපෘතිය ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වෙත ව්‍යාප්ත කරන අවස්ථාවක දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුලින් ගත හැකි අත්දැකීම් රාශියකි.

කුරුණෑගල දිස්ත්‍රික්කය තුල ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන 52 කි. මින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 05 ක ගොවි සංවිධාන පිහිටුවීමේ කටයුතු ව්‍යාපෘතියේ පළමුවන හා දෙවැනි පියවරේදී අවසන් කොට තිබිණ. එනම් ගල්ගමුව ඡන්ද කොට්ඨාශය තුල පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථාන 05 හැර ඉතිරි ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 වෙත මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීම 1984 මැයි මාසයේ සිට ආරම්භ විය. එහිදී එක් ගොවිජන සේවා කමිටු ප්‍රදේශයකින් යාය 02 ක් තෝරාගන්නා ලදී. මෙසේ යාය දෙකක් තෝරා ගැනීමට තුඩුදුන් කරුණු අතර සුළු ගොවි සංවිධානවල ප්‍රායෝගිකතාව *(viability)* ගැන ද සොයා බලන ලදී. යම් හෙයකින් එසේ තෝරාගන්නා ලද යායක සුළුගොවි සංවිධානයක් අසාර්ථක වුවහොත් මුළු ගොවිජන සේවා කමිටු ප්‍රදේශය ගැන දැන ගැනීමට ඇති මං ඇහිරීම නවතාලීමේ පියවරක් වශයෙන් යාය දෙකක් තෝරා සංවිධාන දෙකක් පිහිටුවන ලදී.

යායක පිහිටවූ ගොවි සංවිධානයක සාමාජිකයන් පිළිබඳව සමාජ ආර්ථික සමීක්ෂණයක් එම යායෙහි ගොවි නියෝජිත විසින් කරන ලදී. එම සමීක්ෂණයේදී සැලකිල්ලට ගත් කරුණු අතර ප්‍රධාන තැනක් ගනු ලැබුවේ ඉඩම් ප්‍රමාණය, ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරිත්වය, අමතර ආදායම් මාර්ග සහ අධ්‍යාපන රටාව වැනි පුද්ගලයෙකුගේ ආදායම් තත්ත්වය තීරණය කරන සාධක වේ. මීට අමතරව එම යායේ දක්නට ලැබෙන සාමාන්‍යය තොරතුරු රැස්කිරීමේ ප්‍රශ්නාවලියකට වගා නිලධාරි විසින් පිළිතුරු සපයන ලදී. එමගින් මුළු යාය තුල ඇති ඉඩම් ප්‍රමාණය, ආර්ථික මාර්ග, කෘෂිකාර්මික ඉදිරි වැඩසටහන්, ජලපාලන කටයුතු ආදී තොරතුරු රැස් කෙරිණ.

## ඉතිරි දිස්ත්‍රික්කවල ගොවි සංවිධාන පිහිටුවීම.

ගොවිජන සේවා දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වරුන් මගින් ගොවිජන සේවා කමිටු තෝරාගන්නා ලදී. ඒ ඒ දිස්ත්‍රික්කය බාරව කටයුතු කරන සහකාර කොමසාරිස් තුමා තමන්ගේ දිස්ත්‍රික්කය තුල ගොවි සංවිධාන පිහිටුවීම සඳහා සුදුසු ගොවිජන සේවා කමිටු ප්‍රදේශය නම් කලේය. එක් දිස්ත්‍රික්කයක් තුලින් එක් ගොවිජන සේවා කමිටු ප්‍රදේශයක යාය දෙකක් මේ සඳහා තෝරාගන්නා ලදී. ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමා විසින් ගොවිජන සේවා කමිටු ප්‍රදේශය තෝරා ගැනීමේදී කෘෂිකර්මාන්තයට අදාල ප්‍රශ්න වලින් ගහණ ප්‍රදේශයක් ඒ සඳහා තෝර ගැනීමට උත්සුක විය.

තෝරාගත් යාය 02 ක් තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේදී මෙන් පිලිවෙලින් ගොවි නියෝජිත මහතා හා වගා නිලධාරී මහතා විසින් ගෘහමූලික සමීක්ෂණයක් හා ප්‍රදේශ සමීක්ෂණයක් සිදු කරන ලදී. එම සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් ගොවි සංවිධානය තුල සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ඇති ගොවීන් කවුරුන්ද යන්න පිළිබඳව අවබෝධයක් මෙන්ම එම ගොවීන්ට කණ්ඩායමක් වශයෙන් මුහුණදීමට සිදුවන ගැටළු ආදිය පිළිබඳව ද පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවිය.

## ද්‍රවිඩ දිස්ත්‍රික්ක අත්හැරීම.

ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ජන ගොවීන් ජීවත්වන දිස්ත්‍රික්කවල මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවීම ව්‍යාපෘතියේ අඩුපාඩුවක් වශයෙන් පෙන්වා දිය හැක. යාපනය, මන්නාරම, මුලතිව්, කිලිනොච්චි සහ මඩකලපුව යන ද්‍රවිඩ ජාතීන් ජීවත්වන දිස්ත්‍රික්ක 05 තුල ගොවි නියෝජිතයන් මෙන්ම කෘෂි ක්ෂේත්‍රයට අදාල නිලධාරීන් ද පුහුණු නොකරන ලදී. ඒ සඳහා බලපෑ මූලික කාරණය වශයෙන් පෙන්වා දිය හැක්කේ එම ප්‍රදේශවල පැවති කලබලකාරී වාතාවරණයයි. මීට අමතරව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙන් අග්බෝපුර ගොවිජන සේවා කමිටු ප්‍රදේශය ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ගොවි නියෝජිතයන් හා නිලධාරීන් පුහුණු කිරීම සිදුකරනු ලැබුව ද එම ප්‍රදේශයේ පසුහාර පාඨමාලා පවත්වා ගොවි ප්‍රශ්න තේරුම්ගැනීමට නොහැකි වූයේ ද ප්‍රදේශයේ පැවති කලබලකාරී වාතාවරණය නිසාය.

## 2 වන පරිච්ඡේදය

## ව්‍යාපෘතියේ වැදගත්කම හා පරමාර්ථ

සුළු ගොවියා යනු කවරෙක්ද?

"සුළුගොවියා" නිර්වචනය කිරීමේදී විවිධ න්‍යායාත්මක ගැටළු මතුවන බව පැහැදිලිය. "සුළුගොවියා" නිර්වචනයේදී විවිධ පුද්ගලයින් විසින් විවිධාකාර මිනුම් දඬු පාවිච්චි කරනු ලබන බව පෙනේ.

"සුළුගොවියා" නිර්වචනය කිරීමට ප්‍රථම "ගොවියා" නිර්වචනය කර ගැනීම අධ්‍යයනයේ පහසුව තකා වඩා වැදගත් වේ යයි සිතේ. රේමන්ඩ් පර්ත් *නම් මානව විද්‍යාඥයා විසින් "ගොවියා" නිර්වචනය කර ඇත්තේ "කෘෂිකර්මාන්තය තම පරිභෝජන මාර්ගය වශයෙන් යොදා ගනිමින් කුඩා අන්දමේ ව්‍යාපාරවල යෙදී සිටින මිනිසා" වශයෙනි. ගොවියා පැහැදිලි වශයෙන්ම කෘෂිකර්මාන්තයට සම්බන්ධ වෘත්තීන්හි නිරත වන බව /පර්ත් ගේ අදහස විය.

අක්කර 03 කට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් හිමි කෘෂිකර්මාන්තය හා සම්බන්ධ වෘත්තීන් ප්‍රධාන ජීවනෝපාය වශයෙන් තෝරාගත්, කාලයක් පිස්සේ ඉඩම් වලටම සම්බන්ධ වී කටයුතු කරන පුද්ගලයා "සුළු ගොවියා" වශයෙන් හැඳින්විය හැකිය.

මෙය අප අධ්‍යයනයේ පහසුව තකා ඉදිරිපත් කරනු ලබන නිර්වචනයක් පමණි. මේ නිර්වචනයේ ද යම් යම් අන්දමේ දුර්වලතා තිබෙන බව පිළිගැනීමට සිදුවේ.

ඒ ඒ ප්‍රදේශයන්හි ඉඩම්වල ඇති සශ්‍රීකතාවය පදනම් කරගෙන "සුළුගොවියා" යන්නෙහි නිර්වචනය වෙනස් විය හැක. සමහර විට කුරුණෑගල දිස්ත්‍රික්කය තුලම ගල්ගමුව ප්‍රදේශයෙහි අක්කර 03 ක් භුක්තිවිඳින සුළු ගොවියෙකුට වඩා දොඩන්ගස්ලන්ද වැනි ප්‍රදේශයක එක් අක්කරයක් භුක්තිවිඳින සුළු ගොවියෙකුගේ ආදායම් තත්ත්වය විශාල විය හැක. මේ අනුව ඉඩම්වල විශාලත්වය මෙන්ම සශ්‍රීකත්වය ද "සුළුගොවි" නිර්වචනයක දී වැදගත් බව පෙනේ.කෙසේ වෙතත් සුළු ගොවියා හැඳින්වීම සම්බන්ධයෙන් ඉහතින් ඉදිරිපත් කරන ලද නිර්වචනය තුල න්‍යායාත්මක වශයෙන් මෙන්ම ප්‍රායෝගික වශයෙන් ද යම් යම් අඩුපාඩු දක්නට ලැබෙතත් ව්‍යාපෘතියේ පහසුව සඳහා එවැනි නිර්වචනයක ඇති වැදගත්කම අතිශයින්ම තැපී පෙනේ.

---

* *Firth, R.*

*Malayan Fisherman: Their peasant Economy,*

*Routledge and Kegan paul (1951,6)*

ශ්‍රී ලංකාවේ සුළු ගොවීන්.

ලංකාවේ මුළු ජනගහණයෙන් 80% ක පමණ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන මෙම 80% ක ජනගහණයෙන් 62% ක තරම් පිරිසක් සුළුගොවීන් බව ශ්‍රී ලංකාවේ කරන ලද බොහෝ සමාජ ආර්ථික අධ්‍යයනයන් තුලින් හෙලිවී ඇත. අක්කර 03 කට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් භුක්තිවිඳින, ප්‍රධාන වෘත්තිය වශයෙන් කෘෂි කර්මාන්තය හෝ ඒ සම්බන්ධ විවිධාකාර ක්‍රියාවක නිරත වී සමාජ හා සංස්කෘතිමය වශයෙන් ග්‍රාමීය පරිසරය තුල කාලයක් තුල ජීවත් වූ මේ පිරිස ශ්‍රී ලංකාවේ සංවර්ධනමය ප්‍රයත්න වලදී විශේෂයෙන් කැපී පෙනේ.

ශ්‍රී ලංකාවේ සුළු ගොවීන්ගෙන් ඉතා වැඩි පිරිසක් දුප්පත් අය වෙති. විශේෂයෙන් අඩු ආදායම් තත්ත්වය, අඩු නිෂ්පාදන සාධක, විරැකියාව, නූගත්කම, ප්‍රදේශය තුළ ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාවක් නැතිකම හා බාහිර ලෝකය සමඟ පවත්නා අඩු සම්බන්ධතාවය මෙම දුගී බවට හේතුභූත වන සාධක වෙති.

"සංවර්ධනය" හා ග්‍රාමීය සංවර්ධනය.

"සංවර්ධනය" යන්නට බොහෝ ආර්ථික, සමාජ හා දේශපාලන විද්‍යාඥයෝ විවිධ අරුත් ගෙනහැරපාති. "සංවර්ධනය" යනු ඒකපුද්ගල ආදායමේ වැඩිවීමකි; සංවර්ධනය යනු පුද්ගලයින්ගේ පරිභෝජන රටාව තුල සිදුවන එක්තරා පුළුල් ව්‍යාප්තියකි; සංවර්ධනය යනු පුද්ගලයින් තමන්ගේ වෘත්තීන් තුලින් ලබන ආර්ථික ප්‍රතිලාභයේ එක්තරා වැඩිවීමකි; ආදී වශයෙන් එම නිර්වචනයන් විවිධාකාරව ඉදිරිපත් කොට ඇත. එහෙත් එම සෑම නිර්වචනයක්ම ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට සීමා වී ඇති නිසා ඒ සම්බන්ධ පුළුල් නිර්වචනයක් ලබාගැනීම අපහසු වී ඇත.

ඉහත සඳහන් අදහස් කෙසේ වෙතත් "සංවර්ධනය" යන වචනයේ අර්ථය ඉතාම කෙටියෙන් අප විසින් හැඳින්වුවහොත් "සං" යනු "හොඳ දේ" "වඩාත් යහපත් දේ" හැඳින්වීමට යොදයි. "වර්ධනය" යනු "වැඩිකිරීම" "උසස් කිරීම" යන අරුත් ගෙනදේ. මේ අනුව බලන විට "හොඳ දේ" සමාජයට "යහපත් දේ" දියුණු කිරීම සඳහා ගන්නා එක්තරා ව්‍යායාමයක් වශයෙන් "සංවර්ධනය" යන්න තේරුම් ගත හැක.

මේ අනුව "ග්‍රාමීය සංවර්ධනය" යනු ග්‍රාමීය ප්‍රදේශවල ඇතිවන සමස්ථ ප්‍රගතීන්ගේ එක්තරා සංවිතයක් වශයෙන් හැඳින්විය හැක. එක්තරා ඉන්දියානු ආර්ථිකයෙක් "ග්‍රාමීය සංවර්ධනය" තේ කෝප්පයකට සමාන වෙතැයි දක්වා ඇත. එයට හේතුව නම් තේ කෝප්පය තුල බොහෝ දේ අඩංගු වී ඇත. ඒ තුල තේ, ජලය, සීනි, කිරි ආදී දේ අඩංගු වී ඇත. මේ එක් එක් ද්‍රව්‍යයන් වෙන්ව ගෙන කතා කරන විට ඒ තුල තේ කෝප්පයක අවශ්‍යතා සම්පූර්ණ වී නැත. නමුත් මේ සියල්ලේම ක්‍රමානුකූල ගැලපුම හෙවත්

"සංයෝගය" තේ කෝප්පයක් වශයෙන් හැඳින්වේ. තේ කෝප්පයක් පානය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය ද ශරීරයට එක්තරා උත්තේජනයක් ලැබීමයි. සංවර්ධනය යන ක්‍රියාවලිය තුල ද ඇත්තේ මීටම සමාන අර්ථයකි. සමාජයක ජීවත්වන පුද්ගලයන්ගේ ප්‍රජා සහභාගීත්වය, කණ්ඩායම් ක්‍රියාකාරීත්වය, ඔවුන්ගේ ආර්ථික සැකැස්ම සාමාජීය හා සංස්කෘතික වශයෙන් ඔවුන් දක්වන ප්‍රතිචාරය හා තමා ජීවත්වන සමාජය පාලනය කිරීමට ඔවුන් තෝරාගන්නා නායකයන් තීරණය කිරීම හෙවත් දේශපාලනික වාතාවරණය යන සියළුම ක්‍රියාවන්ගේ මනා ගැලපුම සංවර්ධනය වශයෙන් දැක්විය හැක. මෙම ක්‍රියාවන් එක් එක් වශයෙන් වෙන්කොට ගතහොත් ඒ තුල මනා සංවර්ධන සැකැස්මක් ඉටු වී ඇතැයි කිව නොහැක.

විශේෂයෙන් "ගමක්" සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ දී ද ඉහත සඳහන් සියළුම සංකල්පයන්ගේ මනා පැවැත්මක් අවශ්‍ය බව අපට පෙනේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ දියුණු වෙමින් පවතින රටක "සංවර්ධනය" යන ක්‍රියාවලිය බොහෝසෙයින් ග්‍රාමීය ප්‍රදේශවලට සීමා වී පවතී. ශ්‍රී ලංකා ව වැනි කෘෂිකර්මාන්තය දියුණු වෙමින් පවතින රටක සංවර්ධනමය ප්‍රයත්නයන් බොහෝ විට එම කර්මාන්තය ප්‍රධාන වෘත්තිය කරගත් ජනතාව ආශ්‍රයෙන් සිදුවිය යුතුය යන්න ප්‍රකට කරුණකි.

<u>ග්‍රාමීය සංවර්ධනය ඇති කිරීමෙහිලා ස්වේච්ඡා සංවිධානවල ඇති වැදගත්කම.</u>

ග්‍රාමීය සංවර්ධනය ඇති කිරීමෙහිලා ස්වේච්ඡා සංවිධානවල ඇති වැදගත්කම සාකච්ඡා කිරීමට මත්තෙන් ලංකාවේ ගැමි සමාජය තුල ක්‍රියාත්මක වී පසුව අසාර්ථක වූ ගැමි සංවිධාන වන ග්‍රාම සංවර්ධන සමිතිය, විවිධසේවා සමුපකාර සමිතිය, ප්‍රජා මණ්ඩලය, ග්‍රාමෝදය මණ්ඩලය, වලදාවර්ධන කමිටුව ආදිය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ. ඉහත සඳහන් සියළුම සමිතිවල ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේ ගැමි සමාජයෙහි ජීවත්වන සාමාන්‍ය ගැමියා නොව එම ප්‍රදේශවල සිටින මධ්‍යම පන්තියේ ඉඩම් හිමියන්, පක්ෂ දේශපාලනයේ කැපී පෙනෙන්නන් සහ අධ්‍යාපන ක්‍රමය තුලින් වරප්‍රසාදයන් ලබාගත් ගැමියන්ගේ වචනයෙන් හැඳින්වෙන "වැදගත්" (Elite) යයි හැඳින්වෙන පුද්ගලයන්ය. කාලයක් තිස්සේ සිට දුගී බවේ ගැලී ජීවත් වූ ගැමියන්ගේ හා "වැදගත්" යයි සම්මත පුද්ගලයන්ගේ ආකල්ප රටාවන් හා අපේක්ෂාවන් අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබුණි. ගැමි සංවිධාන වලින් ගැමියා බලාපොරොත්තු වූ දෙයට වඩා හාත්පසින්ම වෙනස් දෙයක් ඉටුවීම එම සංවිධානයන්හි ගැමි සහභාගීත්වය අඩුවීමට ප්‍රධාන හේතුවක් විය. පසුගිය රජය යටතේ ක්‍රියාත්මක වූ වලදාවර්ධන කමිටුව උදාහරණ වශයෙන් ගනිමු. එම කමිටුවේ තීරණ ගැනීමේ වැදගත් ස්ථානයන් හිමිවූයේ ගොවීන්ට වඩා දේශපාලනික වශයෙන් බලපෑම් කළහැකි පුද්ගලයන්ටය. වලදාවර්ධන කමිටුව තුලින් රජය බලාපොරොත්තු වූයේ සෑම ගොවියෙකුටම සමාන සේවයක් සපයමින් කෘෂිකාර්මික සංවර්ධනය ග්‍රාමීය මට්ටම තුලින් නගා සිටුවීමය. එහෙත් ගම් මට්ටමේ දේශපාලනික බලවතුන් එහිදී තීරණ ගැනීම ඒවා ක්‍රියාත්මක කිරීම හා තම පාක්ෂිකයන්ට වැඩි සැලකිල්ලක් දැක්වීම නිසා එම සමිති අසාර්ථක විය.

තත්ත්වය මෙසේ වුවත් ග්‍රාම සංවර්ධන ක්‍රියාවලියෙහිදී මහජන සහභාගිත්වයේ ඇති වැදගත්කම ඉතා විශාලය. ඕනෑම රජයක් විසින් ග්‍රාමීය සංවර්ධනය ඇති කිරීමට උත්සාහ කරන්නේ නම් ඒ ව්‍යායාමය නිතැතින්ම යොමු විය යුත්තේ ගැමි සහභාගිත්වය කෙරෙහි ය. ගැමියන් වෙනුවෙන් දරණු ලබන සංවර්ධන ප්‍රයත්නයන්හිදී ගැමි සහභාගිත්වයෙන් තොරව එය සිදුවන්නේ නම් එහි අසාර්ථකභාවය ඉඳුරාම බලාපොරොත්තු විය හැක. විශේෂයෙන් ගැමියන් සඳහා ඉදිරිපත් කිරීමට උත්සාහ කරන සංවර්ධන ව්‍යායාමයන් බොහොමයක්ම කඩාකප්පල්වීමට මූලික හේතුව වූයේ එය ගැමියන්ට පරිබාහිරව පැවතීමයි.

1979 දී පවත්වන ලද නව ගොවිජන සේවා පනත එක්තරා ආකාරයකට ගොවි සහභාගිත්වය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යොදා ගැනීමට ගත් වෑයමක් ලෙස හැඳින්වීම නිවැරදිය. ගොවිජන සේවා කමිටුවට හා කන්න රැස්වීම්වලට මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළහැකි බව පෙනේ.

<u>ගොවිජන සේවා කමිටුව.</u>

1979 දී පනවන ලද නව ගොවිජන සේවා පනත යටතේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල විෂය ක්ෂේත්‍රයේ මූලික වැදගත්කමක් ගොවිජන සේවා කමිටුව වෙත පැවරේ. මෙම ගොවිජන සේවා පනත ප්‍රකාශයට පත් කිරීමත් සමඟ නව වෙල්විදානේ වරුන් පත් කෙරින. ඒ පත්වීම් කෙරෙන්නේ ප්‍රදේශයේ ගොවීන්ගේ ඡන්දයෙනි. එහිදී නායකත්වය, කෘෂිකාර්මික කටයුතු වලට ඇති හැකියාව හා ගම් මට්ටමේ ජනප්‍රිය පුද්ගලයෙකු වීම යන කරුණු ප්‍රධාන විය. සාමාන්‍යයෙන් සෑම යායකින්ම එක ගොවි නියෝජිතයෙක් තෝරා පත්වූ අතර එම නියෝජිතයන්ගෙන් හය දෙනෙකු ගොවිජන සේවා කමිටුවේ සාමාජිකයෝ වූහ. උදාහරණ වශයෙන් ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශය ගනිමු. මුළු කමිටු ප්‍රදේශයේ ගොවීන් නියෝජනය කිරීම සඳහා ගොවි නියෝජිතයන් 61 දෙනෙකු පත්ව සිටිති. මෙම 61 ක් දෙනාගෙන් ඉතා සමානුපාතික ආකාරයකට ගොවීන් 06 දෙනෙකු කමිටුව වෙත නියෝජනය කෙරේ.

මෙසේ ගොවි නියෝජිතයන් 06 දෙනෙකු ගොවිජන සේවා කමිටුව වෙත නියෝජනය වන්නා සේම ඒ ඒ කෘෂි ක්ෂේත්‍රයට අයත් රජයේ නිලධාරීන් 08 දෙනෙකු නිලධාරීන් වශයෙන් කමිටුව නියෝජනය කරති. ගොවි නියෝජිතයින් 06 දෙනා සහ රජයේ නිලධාරීන් 08 දෙනාගෙන් සැදුම්ලත් ගොවිජන සේවා කමිටුව මාසයකට වරක් රැස්වී ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙහි කෘෂි ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න සාකච්ඡා කොට ඒවා නිරාකරණය කිරීමට අදාල තීරණ ගනී.

<u>කන්න රැස්වීම.</u>

කෘෂි කේෂත්‍රයේ ගොවීන් වෙනුවෙන් තීරණ ගනු ලබන තවත් සංවිධානයක් ලෙස කන්න රැස්වීම ගත හැක. එහෙත් කන්න රැස්වීම්වල ගොවි සහභාගිත්වය ඉතා අඩුය.

මේ සඳහා බලපෑ ඇති කරුණු කෙටියෙන් සාකච්ඡා කරන්නේ නම් එය මෙසේ දැක්විය හැකිය.

1. කන්න රැස්වීම් වලදී ගන්නා වූ තීරණ පිළිපැදීම බොහෝ විට සමහර ගොවීන් විසින්ම මගහැර ඇත. මේ නිසා කන්න රැස්වීම් කෙරෙහි අනෙක් ගොවීන්ගේ විශ්වාසය පළුදුවීම.

2. කන්න රැස්වීමේදී ගනු ලබන තීරණ නිලධාරීන් විසින් කලටවේලාවට ක්‍රියාත්මක නොකිරීම නිසා කන්න රැස්වීම කෙරෙහි ගොවීන් විශ්වාසයක් නොතැබීම.

3. කන්න රැස්වීම් වලදී සමහර නිලධාරීන් තමන්ගේ අදහස් බලයෙන් ගොවීන්ට කාවැද්දීමට උත්සාහ කිරීම නිසා ගොවීන් අසන්තෝෂයට පත්ව සිටීම.

4. කන්න රැස්වීමේදී ගනු ලබන තීරණ මහා වාරිමාර්ග පවතින ප්‍රදේශවල ක්‍රියාත්මක කළහැකි වුවත් සුළු වාරිමාර්ග හා වැසි ජලයෙන් ගොවිතැන් සිදුවන ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම අපහසුවීම.

5. කන්න රැස්වීම බොහෝ විට වී වගාවට පමණක් අදාලව ක්‍රියාත්මක වන නිසා වෙනත් වගාවන් කරන ගොවීන් කන්න රැස්වීම් වලට සහභාගි නොවීම.

<u>සුළුගොවි සංවිධානයක ඇති වැදගත්කම හා පරමාර්ථ පැහැදිලි කිරීම.</u>

මෙම කරුණු ඉතා සැලකිලිමත්ව සලකා බැලූ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සුළු ගොවීන් සංවිධානය කිරීම තුලින් ඔවුන් ප්‍රශ්න විසඳීමට මගක් සලකා දීමට ඇති ඉඩකඩ සොයා බලන ලදී.

මෙම සුළුගොවි සංවිධාන ව්‍යාපෘතියේ පරමාර්ථ මෙසේ සැකෙවින් දැක්විය හැක.

1. සුළු ගොවීන්ට යාය මට්ටමින් ඉතා කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී තම ප්‍රශ්න හඳුනාගැනීමට සැලැස්වීම.

2. එම ප්‍රශ්න හඳුනාගැනීමෙන් පසු ඒවා විසඳා ගැනීම සඳහා කණ්ඩායම තුල ඇති සම්පත් මොනවාදැයි සොයාබැලීම. කණ්ඩායමේ ශ්‍රම ශක්තිය එක් සම්පතක් විය හැක. තම සමූහය ජීවත්වන පරිසරය තුල ඇති භෞතික සම්පත් තවත් සම්පතක් විය හැක. මෙසේ සවශක්තියෙන් ( **Self-reliance).** ගම්මාන දියුණු කිරීමට දිරි ගැනීම.

3. සුළුගොවීන් වෙනුවෙන් රජය මගින් මෙන්ම ස්වේච්ඡා ආයතන වලින් ද ලබාදෙන සේවා සහ සැපයුම් පුද්ගලයින් වශයෙන් නොව කණ්ඩායම් වශයෙන් ලබාගැනීම. උදාහරණ වශයෙන් රජයේ ඒ ඒ ආයතන මගින් ලබාදෙන ගොවිජන සේවා, කෘෂිකර්ම, පොල් සහනාධාර, බැංකු ණය, සත්ව පාලන, සුළු අපනයන වැනි ද්‍රව්‍යමය හා සේවාමය පහසුකම් සුළුගොවි සංවිධාන වලට ලබාදීම.

4. සුළු ගොවීන්ට තම ගොවි සංවිධාන මගින් නිෂ්පාදන සැලසුම් සකස් කිරීමට මග පෙන්වීම. මෙහිදී ගම තුල ඇති ප්‍රශ්න හා ඒවාට විසඳුම් සැපයිය හැකි මාර්ග පැහැදිලි කරන ගොවි කණ්ඩායම් තමන් විසින්ම සකස් කරගත් සැලසුම් යාය මට්ටමේ සිට ප්‍රාදේශිය මට්ටම, දිස්ත්‍රික් මට්ටම හා ජාතික මට්ටම දක්වා ඉදිරිපත් කරති. මෙමගින් ප්‍රාදේශිය හා ජාතික මට්ටමේදී නිෂ්පාදන අරමුණු හා ඉලක්ක සකස් කරගැනීම පහසු කෙරේ.

සුළු ගොවි සංවිධාන ලංකාව පුරා ව්‍යාප්ත කිරීමෙහිලා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කරන ලද වැඩපිළිවෙල විස්තර කිරීම මීලඟ පරිච්ඡේදයේ අරමුණ වෙයි. එම කටයුතු පුහුණුකිරීමේ පාඨමාලා හා පසුහාර පාඨමාලා වශයෙන් අවස්ථා දෙකකින් දක්වා ඇත.

## 3 වන පරිච්ඡේදය

### 1. පුහුණුවීමේ පාඨමාලා පැවැත්වීම.

සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාත් ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වෙතත් ව්‍යාප්ත කිරීම සඳහා පුහුණුවීමේ පාඨමාලා පැවැත්වීම 1984 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක විය. නිකවැරටිය මහව මාර්ගයේ පිහිටි ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට අනුබද්ධව ප්‍රාදේශීය පුහුණුකිරීමේ මධ්‍යස්ථානයේදී මෙම පුහුණු පන්ති පැවැත්විය.

මෙම පුහුණු පාඨමාලා වලදී පුහුණුව ලැබූ නිලධාරීන් සහ පැවැත්වූ පුහුණු පාඨමාලා සංඛ්‍යාව පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා පුහුණු පාඨමාලා | 12 |
| 2. | ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වෙනුවෙන් පුහුණු පාඨමාලා | 05 |

### පුහුණු පන්තිවල ස්වභාවය:

පුහුණු පාඨමාලාවක් දින 03 කින් යුක්ත විය. පාඨමාලා වලට සහභාගී වූ සියලු දෙනාටම නේවාසික හා ආහාර පහසුකම් ද, ගමන් වියදම් ආදිය ද සපයන ලදී. දින 03 ක් පුරා පැවැත්වූ පුහුණු පන්තියක දී සාකච්ඡා කළ කරුණු කෙටියෙන් දැක්වීම කාලෝචිත වේ.

## පුහුණු ලැබීන්

| | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ලංකා බැංකුව | මහජන බැංකුව | කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය නිලධාරීන් | 68 | | | | |
| වගා නිලධාරීන් | 72 | | | | |
| ගොවි නියෝජිතවරුන් | 134 | | | | |
| කාර්මික සහකාරවරු | 26 | | | | |
| සහකාර කොමසාරිස් | 1 | | | | |
| ජ්‍යෙෂ්ඨ කාර්මික සහකාර | 1 | | | | |
| කෘෂිකර්ම උපදේශක | | 46 | | | |
| කෘෂි ව්‍යාප්ති සේවක | | 59 | | | |
| සංවර්ධන සහකාරවරු | | | 22 | 27 | |
| කළමණාකරු (කෘෂි සංවර්ධන අධිකාරිය) | | | | | 13 |
| එකතුව | 303 | 105 | 22 | 27 | 13 |

1. කුරුණෑගල දිස්ත්‍රික්කය වෙනුවෙන් පුහුණුලැබීන් 331
2. ඉතිරි දිස්ත්‍රික්ක වෙනුවෙන් පුහුණුලැබීන් 138

469

## පුහුණු පාඨමාලාවේ පලමුදිනය.

I. සුළු ගොවි සංවිධානයන්හි ඉතිහාසය හා පරමාර්ථ පැහැදිලි කිරීම

පී.ඩී.ආර්. කුමාරසිරි - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

මෙම සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙහි ආරම්භ කිරීමට බලපෑ විශේෂ හේතුසාධක සාකච්ඡාවට භාජනය විය. තවද ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථ පැහැදිලි කිරීම ද මෙහිදී සිදුවිය. විශේෂයෙන් සුළුගොවීන් සංවිධානය වීමේ වැදගත්කමත්, එසේ සංවිධානය වූ පිරිසක් විසින් නෙලාගත හැකි ප්‍රතිඵලත් මෙම පරමාර්ථ පැහැදිලි කිරීමේ විෂයය යටතේ සාකච්ඡාවට භාජනය විය.

II. ග්‍රාමීය සංවිධාන හා සුළු ගොවි සංවිධානයක ඇති වැදගත්කම

විමල් අත්තුඩාවගේ - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ස්වේච්ඡා සංවිධානවල ඉතිහාසය පැහැදිලි කිරීම මෙම දේශනයෙහි මූලික අරමුණ විය.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල දක්නට ලැබෙන ස්වේච්ඡා සංවිධාන හා රජය මගින් ආරම්භ කර ඇති සංවිධාන පිළිබඳව ඉතා කෙටියෙන් හැඳින්වීමක් කොට එම සංවිධාන අතුරින් බොහෝ සංවිධාන අසාර්ථක වීමටත් තවත් සමහර සංවිධාන සාර්ථක වීමටත් බලපෑ කරුණු මෙහිදී සාකච්ඡාවට භාජන විය. ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා මණ්ඩල, ග්‍රාමෝදය මණ්ඩල ආදී සමිති සමාගම් පිළිබඳව වැඩි අවධානයක් මේ දේශනයෙහි දී යොමුවූ අතර, ලංකාවේ බොහෝ ගම්වල ඉතා සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වන මරණාධාර සමිතිය සම්බන්ධයෙන් ද සාකච්ඡා කෙරින. මෙම දේශනයෙහි අවසාන කොටස වූයේ ග්‍රාමීය ස්වේච්ඡා සංවිධාන සහ සුළුගොවි සංවිධාන අතර ඇති සමාන අසමානකම් හා සුළු ගොවි සංවිධානයන් වඩා වැදගත් වන්නේ කෙසේද යන්න පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක් කිරීමයි.

III. "දුගීකම" පිළිබඳව හා "සංවර්ධනය" පිළිබඳව න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කරුණු සාකච්ඡා කිරීම.

පී.ඩී.ආර්. කුමාරසිරි - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

"දුගීකම" හා "සංවර්ධනය" සම්බන්ධයෙන් පෙර අපරදිග විද්වතුන් ඉදිරිපත් කර ඇති සංකල්ප, න්‍යායන් සහ ප්‍රායෝගික කරුණු විශ්ලේෂණාත්මකව සාකච්ඡා කිරීම සඳහා මෙම දේශනය යොදා ගැනින.

IV. ගොවි සංවිධාන පිහිටුවීමේ කාර්යභාරය.
ජේ.පී. ජෝෂී - ආහාර හා කෘෂිකර්ම සංවිධානය.

ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙහි උපදේශක නේපාල් ජාතික ජේ.පී. ජෝෂී මහතා විසින් මෙම දේශනය කරන ලදී. ගොවි සංවිධාන පිහිටුවීමේ කාර්යභාරයෙහි මූලික එළඹුම්, දුෂ්කරතා හා අත්දැකීම් මෙහිදී ඉතා දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය විය.

විශේෂයෙන් සුළු ගොවීන්ගේ සංවිධාන නේපාලයෙන් ආරම්භ වී එම සංවිධාන ක්‍රමය බංග්ලාදේශය, ඉන්දුනීසියාව හා පිලිපීනය වැනි රටවල් කරා ව්‍යාප්ත වූ ආකාරයත් විශේෂයෙන් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් එම කාර්යභාරයේ දී දැක්වූ අනුග්‍රහයත් මෙහිදී සාකච්ඡාවට භාජන විය. එමෙන්ම නේපාලය, බංග්ලාදේශය වැනි රටවලින් ලබාගත් අත්දැකීම් ඇසුරු කරගෙන මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ සමාජ,, ආර්ථික හා සංස්කෘතික පසුතලයට ගැලපෙන අයුරින් සකස් කළයුතු ආකාරයත් එම ව්‍යායාමයේ දී දැරිය යුතු විවිධාකාර ආයාසයන් පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කරන ලදී.

විශේෂයෙන් ගොවි සංවිධාන පිහිටුවීම සඳහා සුදුසු යායක් කෙසේ තෝරාගත යුතුද? ගොවි සංවිධානයක් ආරම්භ කිරීමට ප්‍රථම ප්‍රදේශය පිළිබඳවත් එක් එක් ගෘහමූලිකයා පිළිබඳවත් වෙන වෙනම අධ්‍යයනය කිරීම සඳහා යොදාගත යුතු ප්‍රදේශ හා ගෘහමූලික සමීක්ෂණය පිළිබඳව ද කරුණු සාකච්ඡා කරන ලදී.

පිහිටුවා ගන්නා ගොවි සංවිධානයක් වෙනුවෙන් අනිවාර්යයෙන්ම පුහුණු කරනු ලැබූ ගොවි නියෝජිතයෙකු නායකයා වශයෙන් පත්වීම වැදගත් නොවන බවත් එක් ගොවි නියෝජිත මහතෙකුගේ යාය තුල ගොවීන් 25 දෙනාගේ කණ්ඩායම් වශයෙන් ගොවි සංවිධාන කිහිපයක් පිහිටුවා ගොවි නියෝජිත මහතා එම ගොවි සංවිධාන සියල්ලෙහිම සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් පත්වීම වඩා වැදගත් බවත් මෙම සාකච්ඡාවේ මූල්තැනක් ගත්තේය.

V. ප්‍රාදේශීය සමීක්ෂණයක් කරන අයුරු හා රට එල්ලවන ගැටළු
මහින්ද හේනෙගෙදර - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

මෙම දේශන යටතේ ප්‍රදේශ සමීක්ෂණයක් කිරීමේදී යොදාගත හැකි ක්‍රම හා විද්‍යාත්මක උපායයන් ගැන කරුණු සාකච්ඡා කරන ලදී. තමන්ට නුහුරු ප්‍රදේශයක මෙන්ම තමන්ට හුරු ප්‍රදේශයක ද ප්‍රදේශ සමීක්ෂණයක් කිරීමේදී බලපෑ හැකි විවිධ ගැටළු ආදියත්, එම ගැටළු අවම මට්ටමින් අඩුකරගෙන නිවැරදි ආකාරයෙන් තොරතුරු ලබාගත හැකි ප්‍රාදේශීය සමීක්ෂණයක් කරන ආකාරයත් පිළිබඳව මෙහිදී ගැඹුරින් කරුණු සාකච්ඡා කෙරිණ.

පුස්තකාලය
LIBRARY
ARTI
22259

VI. ගල්ගමුවේ ගොවි සංවිධාන තුළින් ලබාගත් ප්‍රතිඵල සාකච්ඡා කිරීම.
හරිප්‍රියා කරුණාරත්න - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් නියාමක ව්‍යාපෘතියක් වශයෙන් හඳුන්වා දෙන ලද මෙම සුළුගොවි සංවිධාන ව්‍යාපෘතිය නිසා ගල්ගමුව ප්‍රදේශයෙහි ගොවීන්ට අත්වූ වාසි මෙහිදී සාකච්ඡාවට භාජන විය. කණ්ඩායමක් වශයෙන් ණය ලබාගැනීම, තමන් සතු විනාශ වී ගිය වාරිමාර්ග කණ්ඩායමක් වශයෙන් පිළිසකර කර ගැනීම, නිෂ්පාදනය වැඩිකර ගැනීම හා කණ්ඩායම් ඉතුරු කිරීම ආදිය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

VII. ගල්ගමුව සුළුගොවි සංවිධානවල වැදගත්කම (රජයේ නිලධාරී මහතුන්ගේ අත්දැකීම් ආශ්‍රයෙන්)
ඩී.එන්. හෙට්ටිආරච්චි - ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී - ගල්ගමුව.

නියමු ව්‍යාපෘතියක් වශයෙන් ඇරඹි ගල්ගමුව සුළුගොවි සංවිධාන ව්‍යාපෘතිය සමඟ ඉතා කිට්ටු, සම්බන්ධතාවයකින් කටයුතු කළ ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී මහතෙකුගේ අත්දැකීම් මෙම දේශනයේදී සාකච්ඡා කරන ලදී. මෙම සුළුගොවි සංවිධාන ආරම්භ වූ ආකාරයෙන්, මුලදී එම සංවිධාන සම්බන්ධයෙන් තමන් දැක්වූ වැරදි ආකල්ප ගැන ද පසුව එම සංවිධාන තමන්ගේ රාජකාරී පහසු කරවන මාධ්‍යයක් වශයෙන් වැදගත් වූ ආකාරය ද මෙම දේශනයේදී සාකච්ඡා කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශයේ ගොවීන් තමන්ගේ අයිතිවාසිකම් ගැන මනා අවබෝධයකින් සිටින බවත් අවශ්‍ය අවස්ථාවල උද්ඝෝෂණ කිරීමට පවා පුරුදු පුහුණු වී සිටින බවත් මෙම දේශනය මගින් පැහැදිලි කෙරිණ.

VIII. ගල්ගමුව සුළුගොවි සංවිධානයන්හි වැදගත්කම.
(නියමු ව්‍යාපෘතියේ ගොවීන් දෙදෙනෙකුගේ අත්දැකීම්)

ගල්ගමුව සුළුගොවි සංවිධාන නියමු ව්‍යාපෘතියේ ගොවි මහතුන් දෙදෙනෙකු විසින් තමන්ගේ අත්දැකීම් විස්තර කරනු ලැබීම මෙම දේශනයේ මූලික පරමාර්ථය විය. නියමු ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම ගොවීන් මුහුණපාන දුෂ්කරතා විස්තර කිරීම මෙම දේශනයෙහි මූලික හේතුව වූ අතර විශේෂයෙන් ණය ලබාගැනීමට නොහැකිව ඔවුන් ගතකළ දුෂ්කර ජීවිතය පිළිබඳව ද විස්තර අනාවරණය කෙරිණ. එම දුෂ්කරතා මඟහරවා ගෙන ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවා ගැනීමට කණ්ඩායමක් වශයෙන් සංවිධානය වීමේ වැදගත්කම අත්දැකීම් තුළින් තමන්ට වැටහුණු ආකාරය මෙහිදී විස්තර කෙරිණ.

<u>පාඨමාලාවේ දෙවැනි දිනය.</u>

පාඨමාලාවේ දෙවැනි දිනය වෙන්වූයේ ක්ෂේත්‍ර චාරිකාව සඳහා ය. ප්‍රථම දිනයේ දී ලබාගත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම් වෙසෙස් කොපෙත් දුරට ක්ෂේත්‍රය තුල දැකිය හැකි වේ දැයි අධ්‍යයනය කිරීම ක්ෂේත්‍ර චාරිකාවේ අරමුණ විය. පුහුණුවීමේ කණ්ඩායම ගල්ගමුව නියමු ව්‍යාපෘතියේහි ගොවි සංවිධාන දෙකක් තැරඹූ අතර එම ගොවි සංවිධානවල ගොවීන් සමඟ සාකච්ඡා කොට පහත සඳහන් තොරතුරු එක් එක් පුහුණුවන්නා විසින් පුද්ගලිකව සටහන් කර ගන්නා ලදී.

එහිදී රැස් කරගත් තොරතුරු පහත දැක්වේ.

1. කණ්ඩායමේ ආර්ථික ක්‍රියාකාරිත්වය හා කණ්ඩායමේ සාමාජිකයන්ගේ ප්‍රධාන වෘත්තිය, වගා රටාව, නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳ කරුණු.
2. එම කණ්ඩායම රජයේ විවිධ ආයතන සමඟ පවත්නා සම්බන්ධතාවය සතුටුදායක ද යන බව. ඔවුන් කණ්ඩායමක් වශයෙන් ගොවිජන සේවා ප්‍රාදේශීය කාර්යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොල් වගා කිරීමේ මණ්ඩලය, කෘෂි රක්ෂණ මණ්ඩලය හා ප්‍රධාන ණය දෙන බැංකු දෙක සමඟ පවත්නා සම්බන්ධතාවය සතුටුදායක එකක් දැයි මේ කරුණු අනුයෙන් සොයා බැලීම.
3. එම ගොවි සංවිධාන, ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධාන හා අනිකුත් ගොවි සංවිධාන සමඟ පවත්වන <u>සහසම්බන්ධතාවය</u> යන කරුණු පිළිබඳව තොරතුරු ලබාගැනීම.
4. කණ්ඩායමට අනාගත සැලසුම් තිබේද? මෙහිදී විශේෂයෙන් සාකච්ඡාවට භාජන වූයේ ගොවි සංවිධානය කණ්ඩායමක් වශයෙන් තම ප්‍රදේශයේ කෘෂිකාර්මික, සාමාජීය හා ප්‍රජා සංවර්ධන කටයුතු දියුණු කර ගැනීම සඳහා කෙබඳු අනාගත සැලසුම් සකස් කර ඇද්දැයි සොයා බැලීමයි.

පුහුණු පාඨමාලාවට සහභාගී වූ එක් එක් පුහුණුවන්නා විසින් මෙසේ ගොවි සංවිධානයේ ගොවීන් මුණගැසී තොරතුරු රැස්කරන ලද අතර, එම තොරතුරු ප්‍රධාන කණ්ඩායම් දෙකක් වශයෙන් තිකවැරටිය පුහුණුකිරීමේ මධ්‍යස්ථානයේ දී සාකච්ඡා කෙරිණ.

මෙහිදී එක් කණ්ඩායමක් විසින් තමන්ගේ වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, ඒ පිළිබඳව තොරතුරු විවේචනය කිරීම හා ඇගැයීම දෙවන කණ්ඩායමේ කාර්යභාරය විය. පළමුවෙනි කණ්ඩායම මෙසේ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දෙවැනි කණ්ඩායම විසින් ද තොරතුරු ඉදිරිපත් කරන ලද අතර එහිදී පළමුවෙනි කණ්ඩායම විසින් ඒ පිළිබඳ විවේචන ඉදිරිපත් කිරීමත්, තොරතුරු ඇගැයීමත් කරන ලදී.

ක්ෂේත්‍ර චාරිකාවේදී ලබාගත් තොරතුරු සහ න්‍යායාත්මකව ගොවි සංවිධාන සම්බන්ධයෙන් ඉගෙනගත් තොරතුරු සසඳා බැලීම එදිනම පුහුණුවන්නන් විසින් කරන ලදී. විශේෂයෙන් ගල්ගමුව ගොවි සංවිධාන කණ්ඩායමක් වශයෙන් මුහුණපෑ ඇති ගැටළු මොනවාද යන්න පිළිබඳව සාකච්ඡාව මෙහෙයවුණු අතර එම ප්‍රශ්න පුහුණුවන්නන් විසින් ප්‍රායෝගිකව අවබෝධ කරගනු ලැබීමේ වැදගත්කමක් එම ප්‍රශ්නවලට පිළිතුරු ගොවි සංවිධාන මට්ටමින්, ප්‍රාදේශිය මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් ඉදිරිපත් කළයුතු ආකාරයත් පුහුණුවන්නන් හට අභ්‍යාසයක විලාශයෙන් අවබෝධ කර ගැනීමට ඉඩ සලසන ලදී.

<u>ගොවි සංවිධාන පිළිබඳ නාට්‍යය - මෙහෙයවීම - ඩී.ජේ.ඩී. ආර්. ගුණතිලක - ස්ථානභාර නිලධාරි.</u>

පුහුණු පාඨමාලාවේ දෙවන දින අවසාන වූයේ ගොවි සංවිධාන සම්බන්ධ පුහුණුවන්නන් විසින් ඉදිරිපත් කරන රඟපෑමකිනි. මෙහිදී කුසපත් ක්‍රමයකට ගොවි සංවිධානයට සම්බන්ධ නිලධාරීන් මෙන්ම ගොවීන් ද තේරී පත්වන අතර, බොහෝ අවස්ථාවලදී සැබෑ ජිවිතයේ නිලධාරීන් ගොවීන් වශයෙන් ද, ගොවීන් නිලධාරීන් වශයෙන් ද රඟපෑහ. මෙම ගොවි සංවිධාන සම්බන්ධ නාට්‍යයේදී ඔවුන් ලබාගත් ඉතා වැදගත් අත්දැකීම වූයේ, ගොවි සංවිධාන පිහිටුවීම සඳහා ගමකට ගිය විට ගොවීන් වශයෙන් මෙන්ම නිලධාරීන් වශයෙන් ද ඔවුන්ට මුහුණදීමට සිදුවන ගැටළුවල ස්වභාවයක් එවැනි අවස්ථාවක දී තමන් මුහුණදිය යුතු ආකාරය පිළිබඳව අභ්‍යාසයකි.

<u>පාඨමාලාවේ තුන්වන දිනය.</u>

පාඨමාලාවේ තුන්වන දිනය සම්පූර්ණයෙන්ම වෙන්වූයේ තාක්ෂණික කරුණු පිළිබඳව සාකච්ඡාකිරීමටය. ඒ ඒ විෂයන්ට අදාල නිලධාරීන් විසින් මෙම දේශන පවත්වන ලද අතර ඒ ඒ දේශනය අවසානයේ දී අදාල විෂයය සම්බන්ධ ප්‍රශ්න සාකච්ඡා කරන ලදී.

1\. ගෙවතුවල පොල් වගා ව්‍යාප්තිය - ර.එච්.එස්. ගොඩවිට, පොල් සංවර්ධන මණ්ඩලය.

මෙම දේශනයෙහිදී පොල් ගස සම්බන්ධ විද්‍යාත්මක කරුණු රාශියක් පුහුණුවන්නන් හට අවබෝධ කරදෙන ලද අතර, වැඩි ඵලදාවක් ලබාගැනීමේ අරමුණින් පොල් ගස කෙබඳු විද්‍යාත්මක නැඹුරුවක සිට වගා කළ යුතු ද යන්න පිළිබඳව සාකච්ඡා කරන ලදී. රට අමතරව විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාල වන පරිදි සහ ලංකාවේ වෙනත් දිස්ත්‍රික්කවලට අදාල වන පරිදි පොල් වගාවේ සහනාධාර ව්‍යාප්තියක්, ඇතිකරලීම සහ සුළු ගොවි සංවිධාන වැනි කණ්ඩායම් පදනමක සිට එම සහනාධාර ලබාගැනීමට ඇතිවන පහසුකම් ආදිය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

II. වාරිමාර්ග හා ජලපාලනය – මෙය කණ්ඩායමක් වශයෙන් කෙසේ සිදුකළ හැකිද?
දේශක, ආර්.එම්.පී.බී. මඩවල – වාරිමාර්ග තාක්ෂණික සහකාර.

මෙම දේශනය මගින් මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග හා ජලපාලනය සම්බන්ධයෙන් විද්‍යාත්මක හා ප්‍රායෝගික කරුණු රාශියක් සාකච්ඡාවට භාජන වූ අතර ජලපාලනය වැනි කණ්ඩායම් ක්‍රියාකාරීත්වයකදී, සුළුගොවි සංවිධානයකින් ලබාගත හැකි සහාය සාකච්ඡා කෙරිණ.

III. කෘෂිකාර්මික ණය භාවිතය – මෙය කණ්ඩායම් පදනමක් යටතේ කෙසේ සිදුකළ හැකිද?
දේශක ඩී.පී. සෙනරත් මහතා – කලාපීය කළමනාකරු, ලංකා බැංකුව.

මෙම දේශනය පොදු වශයෙන් කෘෂිකර්මාන්තය සඳහා රජය මගින් ගොවීන්ට ලබාදෙන ණය සම්බන්ධ සාමාන්‍ය හැඳින්වීමකි. අනතුරුව ලංකා බැංකුව මගින් ගොවීන් වෙත ලබාදෙන කෘෂිකාර්මික ණය සම්බන්ධයෙන් හා ඒ පිළිබඳව බැංකුවේ ප්‍රතිපත්තීන් පැහැදිලි කිරීමත්, විශේෂයෙන් ග්‍රාමීය මට්ටමේදී ඉදිවන ගොවි සංවිධාන තුළින් ගොවීන්ට කණ්ඩායමක් වශයෙන් ණය ලබා ගැනීමට පහසුවන ආකාරයත්, ණය ආපසු ගෙවීමේ දී වුව කණ්ඩායම් තුළින් කෙරෙන පෙළඹවීම නිසා ගොවීන් ඒ සම්බන්ධව උනන්දු කරවීමෙහිලා වැඩි උද්‍යෝගයක් ඇතිවන ආකාරයත් සාකච්ඡාවට භාජනය විය.

IV. කෘෂිකාර්මික රක්ෂණ ක්‍රමය – දේශක ඒ.එම්. නවරත්න – කෘෂි රක්ෂණ මණ්ඩලය.

මෙම දේශනය මගින් කෘෂි රක්ෂණ ක්‍රමයෙහි ඇති වැදගත්කම සාකච්ඡා කරන ලදී. විශේෂයෙන් ගොවීන් කෘෂි රක්ෂණය පිළිබඳව දක්වා තිබෙන වැරදි ආකල්ප පිළිබඳව කරුණු විවේචනාත්මක මෙහිදී සාකච්ඡා කෙරුණු අතර කෘෂි රක්ෂණය මගින් බැංකු ණය ලබාගැනීම පහසුකරන ආකාරයත්, කුඹුරු පාලුවීමෙන් අනතුරුව වන්දි මුදල් ගෙවනු ලබන ආකාරය පිළිබඳව කෘෂි රක්ෂණ මණ්ඩලයෙහි ප්‍රතිපත්ති පැහැදිලි කිරීම ද සිදුවිය. අනතුරුව ගොවි සංවිධාන වැනි කණ්ඩායම් පදනමක සිට තමන්ගේ වගා පාළු රජයට ඉදිරිපත් කළ හැකි ආකාරයත්, ඒ තුළින් වන්දි ලබාගැනීමේ පහසුවන බවත් පැහැදිලි කෙරිණ.

V. කණ්ඩායම් සහයෝගය මත සත්ව පාලනය දියුණු කරගැනීම.
දේශක මාපා ගුණරත්න – සත්ව පාලන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකාව වැනි කෘෂිකාර්මික රටක සත්ව පාලනයෙහි ඇති වැදගත්කම මෙම දේශනයෙහි මූලික තේමාව වූ අතර සත්ව පාලනය සඳහා රජය මගින් ලබාදෙන සහයෝගය හා ආධාර උපකාර පිළිබඳව ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කරන ලදී.

විශේෂයෙන් සුළු ගොවි සංවිධාන වැනි ග්‍රාමීය කණ්ඩායම් මගින් සත්ව පාලනය සඳහා ව්‍යාපෘතීන් ඇති කරන්නේ නම් ඒ සඳහා සත්ව පාලනය හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවට ලබාදිය හැකි සහයෝගය මෙහිදී පැහැදිලි කෙරිණ.

VI. කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී ඇතිවන ප්‍රශ්න හා ගොවි සංවිධාන පදනම යටතේ ඒවාට පිළිතුරු සැපයිය හැකි අකාරය සාකච්ඡා කිරීම.

දේශක ආර්.පී. රූපසේන - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

ශ්‍රී ලංකාවේ ගොවීන් තමන්ගේ නිෂ්පාදන විකුණා ගැනීමට යාමේදී මුහුණදෙන ගැටළු සාකච්ඡා කිරීම මෙම දේශනයෙහි මූලික තේමාව විය. ගොවියාගේ නිෂ්පාදන පාරිභෝගිකයන් අත්වා යොමු කිරීමේ ක්‍රියාවලිය මෙම දේශනයෙහිදී පැහැදිලි කෙරිණ. අලෙවිය සම්බන්ධ ක්‍රියාවලියේ ඒ ඒ අවස්ථාවලදී කටයුතු කරන පුද්ගලයන් විසින් ගොවියා මෙන්ම පාරිභෝගිකයා ද සූරාකනු ලබන අකාරය පෙන්වා දෙන ලදී. විශේෂයෙන් ලංකාව වැනි රටක ගොවීන් කණ්ඩායම් වශයෙන් සංවිධානය වන්නේ නම් අලෙවිය සම්බන්ධ ක්‍රියාවලියේ විවිධ අවස්ථාවලදී කටයුතු කරන අතරමැදියන් ඉවත්කොට ගොවීන්ට මෙන්ම පාරිභෝගිකයන්ට පහසුව සැලසිය හැකි බවත් ලංකාවේ ජනගහනයෙන් 62% ක් පමණ වන සුළු ගොවීන්ගේ ජීවන තත්ත්වය එමගින් නගා සිටුවිය හැකි බවත් සාකච්ඡා කරන ලදී.

VII. ගොවි සංවිධාන සවකීය නිෂ්පාදන සැලැස්ම කෙසේ සකස් කරගත යුතුද?

දේශක පී.ඩී.ආර්. කුමාරසිරි - ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

සැලැස්මක ඇති වැදගත්කම මෙම දේශනයෙහි මූලික පියවරෙහිදී පැහැදිලි කරන ලද අතර කෘෂිකර්මාන්තය සඳහා ඉදිරිපත් කරන සැලැස්මක ඇති වැදගත්කම මෙහිදී සාකච්ඡා කෙරිණ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන කෘෂිකාර්මික ක්‍රියාත්මක සැලැස්ම හා කන්න රැස්වීම පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලද අතර ගොවි සංවිධානයන් විසින් කෘෂි ක්ෂේත්‍රයට අදාලව සකස් කරගනු ලබන නිෂ්පාදන සැලැස්මෙහි ඇති වැදගත්කම ද සාකච්ඡා කෙරිණ. ගොවීන් ඒ ඒ කන්නයේදී කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීමට පෙර රැස්වී නිලධාරීන් සමඟ ද සාකච්ඡාකොට සකස් කර ගන්නා නිෂ්පාදන සැලැස්ම තුල පහත සඳහන් කරුණු අඩංගු විය යුතු බව ප්‍රකාශ විය.

1. යාය තුළ වගා කෙරෙන මුළු ඉඩම් ප්‍රමාණය කොපමණ ද?
2. එම ඉඩම් ප්‍රමාණය වගා කිරීම සඳහා කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය වේද? ඒ සඳහා තමන් විසින් යොදාගනු ලබන ජල භාවිත ක්‍රමය කුමක් ද?
3. මෙම ඉඩම් ප්‍රමාණය වගා කිරීම සඳහා තෝරාගන්නා බිත්තර වී වර්ගය කවරේද? එය අවශ්‍ය දිනය කුමක්ද?/අවශ්‍ය ප්‍රමාණය කොපමණද?
4. මෙම ඉඩම් වගා කිරීමට බලාපොරොත්තු වන දිනය කවදාද?
5. මෙම ඉඩම් ප්‍රමාණය සඳහා භාවිතා කළයුතු පොහොර වර්ගය කුමක්ද? අවශ්‍ය ප්‍රමාණය හා ඒවා ලබාගත යුතු දිනය කුමක්ද?
6. අවශ්‍ය කරන කෘෂි යෙදවුම් හා කෘෂිකාර්මික දැනුම කෙසේ ලබාගත යුතුද? හා ඒ සඳහා යොදාගත යුතු මාර්ග කවරේද?
7. මෙම කුඹුරු වගා කිරීම සඳහා යොදාගන්නා වගා රටාව කුමක්ද?
8. මෙම කුඹුරු වන සතුන්ගෙන් මෙන්ම වගා පාඩුවීම් වලින් වලක්වා ගැනීම සඳහා කෙබඳු ව්‍යායාමයක් දැරිය යුතුද?
9. අස්වැන්න වැඩිකර ගැනීමේ ව්‍යායාමයේදී කෘෂි අස්වැන්න නිවැරදිව නෙලාගත යුත්තේ කෙසේද?
10. කෘෂි නිෂ්පාදන විකුණා ගැනීමේදී කණ්ඩායම් සහයෝගය මත ක්‍රියා කළයුත්තේ කෙසේද?

VIII. "ගොවි සංවිධාන පදනම යටතේ කණ්ඩායම් ඉතුරුකිරීම්වල වැදගත්කම"
ජ්‍යෙෂ්ඨ විමල් අත්තුඩාවගේ – ගොවිජන සේවා දෙපාර්තමේන්තුව.

ගොවි සංවිධාන පදනම යටතේ ගොවීන් කණ්ඩායමක් වශයෙන් සංවිධානය වී සවකීය කෘෂි නිෂ්පාදන කටයුතු කරන අතරම එමගින් තමන් ලබන ආදායමින් එක්තරා ප්‍රමාණයක් කණ්ඩායම් ඉතුරු කිරීම් මගින් තැන්පත් කරගැනීමේ ඇති වැදගත්කම මෙහිදී සාකච්ඡා කරන ලදී. ගොවීන්ට මුදල් වලින් පමණක් නොව ධාන්‍ය වලින් වුවද මෙම ඉතුරුම් ආරම්භ කිරීමට හැකි බවත් එසේ ඉතුරු කරගන්නා දේ යොදවා තමන්ගේ ගොවි සංවිධානයට අවශ්‍ය කෘෂි උපකරණ ආදිය මිලට ගත හැකි ආකාරයත් මෙහිදී සාකච්ඡා කෙරිණ.

<u>පාඨමාලාව සමාප්ත කිරීම.</u>

මෙම පාඨමාලාවේ අවසානයේ දි දින 03 ක් මුළුල්ලේ සාකච්ඡා කළ කරුණු සමාලෝචනය කරන ලදී. විශේෂයෙන් න්‍යායාත්මකව, සංකල්පනාත්මක හා ප්‍රායෝගිකව ගොවි සංවිධාන පිළිබඳව ලබාගත් කරුණු පිළිබඳව ඇගැයීමක් කරන ලද අතර, ඒ ඒ ප්‍රදේශ වලින් පැමිණි ගොවි නියෝජිතයන්, මෙන්ම ඒ ඒ කෘෂි ක්ෂේත්‍රයන් භාරව කටයුතු

කරන නිලධාරීන් විසින් තමන්ගේ ක්ෂේත්‍රවල ගොවි සංවිධාන පිහිටුවීමෙහිලා කළයුතු සංවිධාන වැඩ මෙහිදී සාකච්ඡා කරන ලදී.

තමන්ගේ ක්ෂේත්‍රවල පවතින යම් යම් ගැටළු පිළිබඳව සාකච්ඡාවෙන් අනතුරුව ගොවි සංවිධාන සඳහා සුදුසු යාය ප්‍රදේශ තෝරාගෙන ඒවා පිළිබඳ ප්‍රදේශ සමීක්ෂණයක් හා ගෘහමූලික සමීක්ෂණයක් කළයුතු ආකාරය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී. ඉන්පසු තම තමන්ගේ ප්‍රදේශවල ගොවි සංවිධාන පිහිටුවීමේ අභිලාෂයෙන් යුතුව පුහුණුව ලැබූ කණ්ඩායම විසිර යන ලදී.

2. <u>පසුහාර පාඨමාලා.</u>

අලුතින් පිහිටවූ ගොවි සංවිධාන සඳහා ගොවි සංවිධාන ව්‍යාපෘතියෙහි පසුහාර පාඨමාලා, කලින් නියම කරගත් දිනයන්හි ඒ ඒ ගම්වලට ගොස් පවත්වන ලදී.

මෙම පසුහාර පාඨමාලා මූලික වශයෙන් පහත දැක්වෙන ආකාරයට පවත්වන ලදී.

1. ගොවීන් සමඟ සාමාන්‍ය කරුණු සාකච්ඡා කිරීම. තමන්ගේ යාය ප්‍රදේශයෙහි ඇති ප්‍රශ්න මොනවාදැයි අවබෝධයක් ලබාගැනීම සඳහා ගොවීන් සමඟ කරුණු සාකච්ඡා කිරීම, විශේෂයෙන් ගොවීන්ට තමන්ගේ කෘෂිකාර්මික කටයුතු කරගෙන යාමේදී මුහුණදීමට සිදුවන මූලික ප්‍රශ්න ගැන සාමාන්‍ය අදහසක් ලබාගැනීම මෙහි ප්‍රධාන අරමුණ විය.

2. යාය මට්ටමෙන් රැස්වී සිටින ගොවීන්ට ගොවි සංවිධාන ව්‍යාපෘතිය හඳුන්වාදීම. ගොවි සංවිධාන ව්‍යාපෘතියෙහි ඉතිහාසය, වර්තමාන ක්‍රියාකාරීත්වය හා පරමාර්ථ පැහැදිලි කිරීමත් ගොවීන් කණ්ඩායමක් වශයෙන් සංවිධාන වීම තුලින් නෙලාගත හැකි ප්‍රතිඵල ආදියත් මෙහිදී සාකච්ඡාවට භාජන විය.

3. ගොවීන් සමඟ සාමාන්‍ය කරුණු සාකච්ඡා කිරීමේදී අවබෝධ කරගත් තොරතුරු හා ඔවුන්ගේ ගොවි ගැටළු ආශ්‍රයෙන් ඒ ඒ ප්‍රදේශයට අදාල වන පරිදි ගොවි සංවිධාන කෙසේ පිහිටුවා ගත යුතුදැයි ප්‍රායෝගික වශයෙන් විමසා බැලීම මෙම පසුහාර පුහුණුකිරීම් කටයුතු වල තුන්වන අවස්ථාවේදී සිදුවිය.

4. මෙසේ කණ්ඩායමක් වශයෙන් සංවිධානය වී සිටින ගොවි පිරිස විසින් කෘෂි ක්ෂේත්‍රයට අදාලව කටයුතු කරන රජයේ නිලධාරීන්ගේ සහාය ලබාගෙන තම නිෂ්පාදන සැලැස්ම කෙසේ සකස් කරගත යුතුද යන්න ගොවීන් සමඟ සාකච්ඡා කිරීම.

මෙම පසුහාර පාඨමාලා , ගොවි සංවිධාන ව්‍යාපෘතියෙහි ඉතා වැදගත් තැනක් ගත් අතර ඒ තුලින් ලබාගත හැකි වූ අත්දැකීම් සම්භාරය ඉතා විශාලය. විශේෂයෙන් ඒ ඒ ගොවි සංවිධානයේ සාමාජිකයන් වන ගොවීන් සෙලින්ම මුණගැසී ඔවුන්ට මෙම ව්‍යාපෘතිය පිළිබඳව දැනුම ලබාදීම මෙහිදී ඉතා වැදගත් වූ අතර ගොවි සංවිධාන පිහිටුවීමේ කාර්යාරයේදී එය ඉතා ප්‍රයෝජනයත් විය.

මේ අනුව මෙම පසුහාර පුහුණුවීමේ පාඨමාලා කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ගොවිජන සේවා මධ්‍යස්ථාන 52 වෙනුවෙන් පවත්වන ලදී. මීට අමතරව ලංකාවේ ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටවූ ගොවි සංවිධාන සඳහා ද මෙම පසුහාර පුහුණු කරවීමේ කටයුතු සිදු කරන ලදී. මෙම පසුහාර පාඨමාලා පැවැත්වූ ප්‍රදේශ , දිස්ත්‍රික්ක හෝ ගොවි සංවිධාන සංඛ්‍යාව මෙම ලිපිය අවසානයේ දක්වා ඇත.

3. <u>ත්‍රෛමාසික පුහුණුවීමේ වැඩමුළුව.</u>

මෙම වැඩමුළුව සඳහා නිකවැරටිය ප්‍රාදේශීය පුහුණුකරවීමේ මධ්‍යස්ථානයට කැඳවනු ලැබුයේ ගොවි සංවිධානවල නායකයන්, ගොවි නියෝජිත මහතුන් හා වගා නිලධාරී මහතුන්ය. මේ අනුව එක් ගොවි සංවිධානයකින් ගොවි සංවිධානයේ නායකයා ගොවි නියෝජිත මහතා සහ එම ගොවි සංවිධාන ප්‍රදේශයේ වගා නිලධාරී මහතා පුහුණුව සඳහා කැඳවනු ලැබීය. කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා මෙසේ ත්‍රෛමාසික පුහුණුවීමේ පාඨමාලා සැසිවාර 04 ක් පවත්වන ලදී.

<u>ත්‍රෛමාසික වැඩමුළුවේදී සාකච්ඡා කළ කරුණු:</u>

I. ප්‍රගති සමාලෝචන වාර්තා ඉදිරිපත් කිරීම:

මෙම ත්‍රෛමාසික වැඩමුළුව දින 02 ක පුහුණුවීමේ සැසිවාර වශයෙන් පැවැත්විය. පළමු දිනයේ දී දැනට කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා පිහිටුවා ඇති ගොවි සංවිධාන වල නායකයන් විසින් තම තමන්ගේ ගොවි සංවිධානවල ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබ ඒ පිළිබඳ වාර්තා සභාව වෙත ඉදිරිපත් කරන ලදී. මේ අනුව එක් පුහුණුවීමේ සැසිවාරයකට අඩු තරමින් ගොවි සංවිධාන 13 ක නායකයින් පැමිණි අතර ඒ ඒ ගොවි සංවිධානයේ නායකයා විසින් තමන්ගේ ගොවි සංවිධානය පසුගිය මාස 3 තුළදී ලබාඇති ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. අනතුරුව ඒ ඒ ගොවි සංවිධානයේ ගොවි නියෝජිත මහතා සහ වගා නිලධාරි මහතා විසින් තම තමන්ගේ ගොවි සංවිධානයේ ක්‍රියාකාරිත්වයට බලපාන ගැටළු හා බාධක මොනවාදැයි සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

II. ගොවි සංවිධානයක සාර්ථකත්වය සහතික කරනුවස් අදාල ආයතන විසින් ලබාදෙන සහාය කවරේද?

දේශක විමල් අත්තුඩාවගේ - ගොවිජන සේවා දෙපාර්තමේන්තුව.

විශේෂයෙන් මෙම සුළුගොවි සංවිධාන ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව වශයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ක්‍රියා කරන අතර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් අනිකුත් කෘෂි ක්ෂේත්‍රයට අයත් රජයේ නිලධාරීන්ගේ සහාය ගොවි සංවිධාන වෙත ලබාගන්නා ආකාරය මෙහිදී සාකච්ඡා කරන ලදී.

III. ගොවි සංවිධානයක නායකයින් විසින් තම සංවිධානයේ මුදල් වාර්තා, පැමිණීමේ වාර්තා සහ සාකච්ඡා සටහන් කෙසේ තබාගත යුතුද?

දේශක ඩී.ජේ.ඩී.ආර්. ගුණතිලක - ස්ථානභාර නිලධාරී
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය.

## IV. ගොවි සංවිධාන සවතීය සංවිධානවල නිෂ්පාදන සැලැස්ම විද්‍යාත්මක පදනමක් යටතේ කෙසේ සකස් කරගත යුතුද?

දේශක වින්ධ්‍යා වඩිගමංගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.

මීට ඉහත පැවැත්වූ පුහුණු පාඨමාලාවේදී ගොවි සංවිධානයක් විසින් තමන්ගේ නිෂ්පාදන සැලැස්ම කෙසේ සකස් කරගනු ලැබිය යුතුද යන්න පිළිබඳව සාකච්ඡා කෙරිණ. එහෙත් මෙම දේශනයේදී ඊට වඩා විද්‍යාත්මක පදනමක ඒ ගැන කරුණු ඉදිරිපත් කිරීම සිදු විය. උදාහරණ වශයෙන් එක් අක්කරයක් සඳහා අවශ්‍ය කරන බිත්තර වී ප්‍රමාණය, පොහොර ප්‍රමාණය, ජල ප්‍රමාණය ආදිය පිළිබඳව සැලකිල්ල යොමු කරමින් ඒ ඒ ගොවි සංවිධානය විසින් නිෂ්පාදන සැලැස්ම කෙසේ සකස් කරගත යුතුද යන්න පිළිබඳව සාකච්ඡා කෙරිණ.

### <u>ත්‍රෛමාසික වැඩමුළුවේ දෙවන දිනය.</u>

1. <u>ක්ෂේත්‍ර චාරිකාව.</u>

මෙම වැඩමුළුවට සහභාගි වූ පිරිස කණ්ඩායම් දෙකක් වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය තුල අලුතින් පිහිටුවන ගොවි සංවිධාන දෙකක් නැරඹීම සඳහා කැඳවාගෙන යන ලදී. මීට සහභාගි වූ පිරිස එම ගොවි සංවිධාන දෙකෙහි ගොවි සාමාජිකයන් මුණගැසී පුද්ගලිකව ඔවුන්ගෙන් ඒ සම්බන්ධ තොරතුරු ලබාගත්හ. මෙසේ ලබාගත් තොරතුරු අතර ඉතා වැදගත් තැනක් ගත්තේ, ගොවි සංවිධාන පිහිටවූ ආකාරය, ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරීත්වය, සංවිධානය වීම පිළිබඳව ඔවුන්ගේ අදහස හා කණ්ඩායමක් වශයෙන් ඔවුන්ට අනාගත සැලසුම් තිබේද යන්න ආදියයි.

2. <u>ක්ෂේත්‍ර චාරිකා වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම හා ගොවි සංවිධානවලට මුහුණපෑමට ඇති ගැටළු අවබෝධ කර ගැනීම.</u>

මෙහිදී ගොවි සංවිධාන නැරඹීමෙන් හා ගොවීන් සමඟ එම සංවිධාන පිළිබඳව සාකච්ඡා කිරීමෙන් ලබාගත් අභ්‍යාසය ආශ්‍රය කරගෙන එය තම තමන්ගේ ගොවි සංවිධාන සමඟ කෙසේ සැසඳිය යුතු දැයි අවබෝධ කරගැනීම වැදගත් ලෙස සලකන ලදී. මෙහිදී විශේෂයෙන් ගොවි සංවිධාන පිහිටුවා මාස 03 කට පසු එම සංවිධානය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී මුහුණදෙන ප්‍රශ්න මොනවාදැයි තේරුම් ගැනීමට උත්සාහ කරන ලදී. අනතුරුව එම ගැටළු වලට විසඳුම් ගොවි සංවිධාන ව්‍යූහයේ ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක හා ජාතික මට්ටම් තුලින් කෙසේ ළඟාකර ගත හැකි දැයි සොයා බලන ලදී.

3. **සුළු ගොවි සංවිධාන අනාගතයේ දී ඉටු කිරීමට බලාපොරොත්තු වන කාර්යභාරය සාකච්ඡා කිරීම.**

මෙය ත්‍රෛමාසික වැඩමුළුවෙහි දෙවන දිනයෙහි අවසාන කාර්යය වශයෙන් හැඳින්විය හැකිය. දින දෙකක් පුරා ලබාගත් දැනුම ඉවහල් කරගෙන ගොවි සංවිධාන තුළ ඇති අඩුපාඩු සහ ගැටළු විසඳීම සඳහා ඉදිරිපත් කළ හැකි ක්‍රමෝපායයන් මෙහිදී සලකා බලන ලදී. අනාගතයේදී තමන්ගේ ගොවි සංවිධානය විසින් කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් සභාව වෙත යෝජනා කිරීමෙන් අනතුරුව මෙම වැඩමුළුව අවසන් විය.

4. **කුරුණෑගල දිස්ත්‍රික්කයේ උපදිසාපති වරුන් හා කෘෂි සංවර්ධන කළමණාකරුවන් සඳහා පුහුණු පාඨමාලාවක් පැවැත්වීම.**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ දී එක් දින පුහුණුවීමේ පාඨමාලාවක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සේවය කරන උප දිසාපති වරුන් 12 දෙනෙකු සහ කෘෂි සංවර්ධන කළමණාකරුවන් 5 දෙනෙකු වෙනුවෙන් පවත්වන ලදී. සුළුගොවි සංවිධාන ව්‍යාපෘතියේ ඉතිහාසය එහි වැදගත්කම හා පරමාර්ථ සහ වර්තමාන ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීම මෙම එක් දින වැඩමුළුවේ මූලික අරමුණ විය.

කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා දැනට ව්‍යාප්ත කොට ඇති සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියට අදාළව ප්‍රාදේශීය උපදිසාපති වරුන්ට පැවරෙන කාර්යභාරය වෙත වැඩි අවධානයක් යොමු කිරීම මෙම පුහුණු වැඩමුළුවේ තවත් පරමාර්ථයක් විය. කුරුණෑගල මහ දිසාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩමුළුව මගින් ගොවි සංවිධාන පිළිබඳව මනා අවබෝධයක් ප්‍රාදේශීය උපදිසාපති වරුන්ට මෙන්ම කෘෂි සංවර්ධන අධිකාරියේ කළමණාකරුවන්ට ද ලබාදෙන ලදී.

5. **ශ්‍රී ලංකාවේ දිසා පති වරුන් වෙනුවෙන් පැවැත්වූ වැඩමුළුව.**

ශ්‍රී ලංකාවේ ඒ ඒ දිස්ත්‍රික්කවල සේවය කරන දිසාපති වරුන් වෙනුවෙන් එක් දින පුහුණු වැඩමුළුවක් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණ. මෙම වැඩ-මුළුවේ මූලික අරමුණ වූයේ දැනටමත් ඒ ඒ දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති සුළු ගොවි සංවිධාන වලට අදාලව දිසාපති වරුන්ට පැවරෙන කාර්යභාරය කුමක් ද යන්න පිළිබඳව විශ්ලේෂණාත්මක මට්ටමින් කරුණු පැහැදිලි කරදීමයි.

6. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් භාර සහකාර කොමසාරිස් වරුන් වෙනුවෙන් පැවැත්වූ වැඩමුළුව.

සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියට අදාළව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුවක් වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ගොවිජන සේවා සහකාර කොමසාරිස් වරුන් විසින් ඉටු කළයුතු කාර්යභාරය ඉතා විශාලය. මේ පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කිරීම පිණිස එක්දින පුහුණු පාඨමාලා වක් කොළඹ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ දී පැවැත්විණ.

මෙම එක්දින පුහුණු පාඨමාලාවේදී සාකච්ඡා කළ කරුණු සංක්ෂේපයෙන් දක්වන්නේ නම් එහිදී පළමුව මෙම ව්‍යාපෘතියේ ඓතිහාසික පසුබිම සාකච්ඡා කරන ලදී. අනතුරුව ව්‍යාපෘතියේ වර්තමාන ක්‍රියාකාරීත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සිදුවිය. ව්‍යාපෘතියේ පරමාර්ථ, ගොවි සංවිධාන පිහිටුවීම හා ඒ සම්බන්ධයෙන් ඇතිවූ ගැටළු සම්බන්ධව ද මෙහිදී කරුණු පැහැදිලි කෙරිණ.

ඊළඟ වැදගත් පරමාර්ථය වූයේ සුළු ගොවි සංවිධාන සම්බන්ධ මූලික සංකල්ප පැහැදිලි කිරීමයි. එම දේශනයෙන් පසුව ගොවි සංවිධාන වලට අදාළව අනිකුත් රජයේ ආයතන කෙරෙන් ලබාගත හැකි සහාය කොබඳු ද යන්න සාකච්ඡා කිරීමයි.

දේශන වලින් අනතුරුව වැදගත් සාකච්ඡා වටයක් පැවැත්විණ. මෙහිදී සහකාර කොමසාරිස් වරුන් විසින් සවකීය දිස්ත්‍රික්කවල ගොවි සංවිධාන පිහිටුවීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටළු පිළිබඳ ඉතා ගැඹුරින් විවාදාත්මකව, මෙන්ම තර්කානුකූලව ද කරුණු සාකච්ඡා කරන ලදී.

# හතරවන පරිච්ඡේදය

## සමාලෝචනය

ප්‍රතිඵල, අත්දැකීම් හා ගැටළු විවේචනාත්මකව විග්‍රහ කිරීම.

ගල්ගමුව සුළු ගොවි සංවිධාන නියමු ව්‍යාපෘතිය තුලින් ලබාගත් ප්‍රතිඵල, අත්දැකීම් මෙන්ම මුහුණදුන් ගැටළු ආදිය මෙම ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාත් ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වෙතත් ව්‍යාප්ත කිරීමේදී බෙහෙවින් උපයෝගී විය. මේ වනවිට ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කොට මාස 09 ක පමණ කාලයක් ගත වී ඇත. මෙම සුළු කාලය තුල ලැබූ ප්‍රතිඵල හා අත්දැකීම් තවමත් ගැඹුරු මට්ටමින් විග්‍රහ කිරීම උගහට ය. එහෙත් එම ප්‍රතිඵල හා අත්දැකීම් ආදිය මෙම ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙනයාමෙහිලා උපකාරවත් වන බව පැහැදිලි ය.

පුද්ගලයන්ගේ 'කණ්ඩායම් - සවිඥානය' මෙම ව්‍යාපෘතිය තුලින් ඇතිකල වැදගත් ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැක. 'පුහුණු පාඨමාලාවේ දී මෙන්ම පශ්චාර පාඨමාලාවල දී ද බොහෝ ගැමියන් දැක්වූ අදහස වූයේ ගම විවිධ හේතූන් මත භේදභින්න වී තිබෙන බවය. එම තත්ත්වය නැතිකර එකම ගමක පුද්ගලයන් වශයෙන්, එකම යායක ගොවි කණ්ඩායමක් වශයෙන්, එකම ජලපාලන ක්‍රමයක් භාවිත කරන පිරිසක් වශයෙන් ඔවුන් සමූහ - විඥානයට මුල්තැන දෙමින්, ගම තුල සමගිය ඇතිකරලීමට කැමැත්තක් දැක්වීම ඉතා වැදගත් කරුණක් ලෙස අගය කළ හැක. විශේෂයෙන් මෙම "සමූහ සවිඥානක" බව කිසියම් ගමක් තුල ඇතිවීමට නම් එම ගම තුල ජීවත්වන බොහෝ දෙනා විසින් පසක් කරගනු ලැබූ ප්‍රශ්නයක් ඔවුන් අතර තිබිය යුතුය. නැතිනම් ඒ ගමතුල ජීවත්වන සියළු දෙනාටම පොදු "අරමුණක්" තිබිය යුතුය. මෙම අරමුණ සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය තුලින් ක්‍රමයෙන් ජනිතවන බව මෙහිදී මතක් කිරීම වැදගත් වේයි.

මෙම කණ්ඩායම් - සවිඥානය පදනම් කරගෙන ගොවීන් කෘෂි ක්ෂේත්‍රයේ කටයුතු වලට සම්බන්ධවීම ව්‍යාපෘතියෙන් ලද තවත් ජයග්‍රහණයක් ලෙස පෙන්වා දිය හැක. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවන ලද බොහෝ ගොවි සංවිධාන විසින් කණ්ඩායම් නිෂ්පාදන සැලැස්මට මුල්තැන දෙමින් තම තමන්ගේ යාය ප්‍රදේශයන්හි විවිධ ව්‍යාපෘති ආරම්භ කර තිබීම සතුටට කරුණකි. කණ්ඩායම් ක්‍රියාකාරීත්වයට මුල්තැන දෙමින් තමන්ගේ යාය තුල එකම බීජ්තර වී වර්ගයක් පාවිච්චි කිරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන කෘෂිදැනුම ලබාගැනීම, ජලපාලනය සමූහ පදනමක් යටතේ ක්‍රියාත්මක කිරීම මෙම සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියේ පරමාර්ථ ඔවුන් සාක්ෂාත් කරගෙන ඇති බවට සාධක විය හැක.

ශ්‍රී ලංකාවේ බොහෝ ගම්වල දුගීකම නිරූපනය කරන ප්‍රධාන සාධකයක් නම් ග්‍රාමීය ණයගැති භාවයයි. විශේෂයෙන් ගොවීන් රජයේ ආයතන වන ලංකා බැංකුවටත්, මහජන බැංකුවටත්, ග්‍රාමීය සමුපකාර බැංකු වලටත් ණය ගැතිව සිටීම සුලබ ලක්ෂණයකි.

බොහෝ අවස්ථාවලදී ගොවීහු රජයේ ආයතන වලින් ලබාගත් ණය ආපසු ගෙවීම ප්‍රමාද කරති. මෙම පුරුද්ද නැති කිරීම සඳහා විශේෂයෙන් පුහුණු පාඨමාලා වලදී මෙන්ම පසුකාර පාඨමාලා වලදී ද ගොවීන්ට කරුණු පැහැදිලි කිරීමේ අවස්ථාව අප වෙත ලැබින. පුහුණු පාඨමාලාවට පැමිණි බොහෝ ගොවීහු තමන්ගේ කල් පැන ගිය ණය ගෙවා දැමීමෙන් කණ්ඩායම් සවිඥානයට මුල්තැන දී ගොවි සංවිධානයේ වගකීම හා සහතික කිරීම මත බැංකු වලින් ණය ලබාගැනීම වැදගත් ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක. කුරුණෑගල දිස්ත්‍රික්කයේ බොහෝ ගොවි සංවිධානවල ගොවීහු මෙම කණ්ඩායම් සහතිකය මත තමන්ට අවශ්‍ය අත් ට්‍රැක්ටර් යන්ත්‍ර සහ ස්ප්‍රේයර් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා බැංකු වලින් ණය ලබාගත් අවස්ථා දක්නට ලැබින.

කෘෂි ක්ෂේත්‍රයට පරිබාහිර වෙනත් ව්‍යාපෘතීන් ද ගොවි සංවිධාන මගින් ආරම්භ කිරීම තවත් යහපත් ප්‍රතිඵලයකි. මෙසේ ආරම්භ කල ව්‍යාපෘතීන් අතර සත්ව පාලනය, මිරිදිය මසුන් ඇති කිරීම, පොල් වගා කිරීමේ සහනාධාර ලබාගැනීම හා ගෙවතු වගා කිරීම වැනි විවිධ ව්‍යාපෘතීන් වෙයි. ගල්ගමුව ප්‍රදේශයේ පිහිටවූ ගොවි සංවිධානයක් විසින් ගමේ කුඩා වැවක මිරිදිය මසුන් ඇතිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කොට ඇති අතර එම ගොවි සංවිධානය තුලින් එම ව්‍යාපෘතිය රැකබලා ගන්නා පිරිස නම් කොට තිබීම මේ සඳහා කදිම නිදර්ශනයකි. වීරඹුගෙදර, ගොවි සංවිධානය විසින් කුඩා ළමුන් අතර මනා සෞඛ්‍ය පුරුදු ඇති කිරීම සඳහා සෞඛ්‍ය කටයුතු සම්බන්ධ ව්‍යාපෘතියක් අරඹා ඇත. තිගලව ගොවි සංවිධානය විසින් වැඩිහිටියන් සඳහා කෘෂිකර්ම අධ්‍යාපන වැඩ සටහන් ආරම්භ කොට ඇත. මෙලෙස කෘෂිකර්මයට අදාලව මෙන්ම කෘෂිකර්මයට අදාල නොවන, එහෙත් ප්‍රදේශ ප්‍රජා සංවර්ධන කටයුතු දියුණු කිරීමේ අරමුණින් විවිධ ව්‍යාපෘතීන් ගොවි සංවිධාන ආශ්‍රයෙන් ආරම්භ කර තිබීම දැකිය හැක.

බොහෝ ගොවි සංවිධාන විසින් ආරම්භ කර ඇති කණ්ඩායම් ඉතිරිකිරීම් ව්‍යාපෘතීන් ද මෙහිදී සඳහන් කිරීම වැදගත් වෙයි. ග්‍රාමීය ගැමි ජනතාවට සවකීය ඉතුරුකිරීමේ පුරුදු වැඩිදියුණු කිරීමට බාධා පමුණුවන අවස්ථා දෙකක් මෙම ව්‍යාපෘතිය ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමට හැකිවිය. ඉන් පළමුවැන්න නම් ගොවීන්ගේ අඩු ආදායම් තත්වයයි. දෙවන කරුණ නම් ඉතිරිකිරීමේ වැදගත්කම පිළිබඳව ඇති අඩු අවබෝධයයි. බොහෝ අවස්ථාවලදී කන්නයේ අස්වනු විකිණීමෙන් පසුව තමන්ගේ මුදල් අනවශ්‍ය දෑ මිලදී ගැනීම සඳහා යොදවති. තමන් ඉතා මහන්සියෙන් උපයාගත් ධනයෙන් කොටසක් ඉතිරි කිරීමෙන් තමන්ට අනාගතයේදී අත්වන වාසි සම්බන්ධයෙන් දක්වන්නේ අඩු සැලකිල්ලකි. ව්‍යාපෘතියේ පුහුණු කරවීමේ කණ්ඩායම විසින් ගොවීන් අතර ඉතුරුම් පුරුදු දෙකක් ඇති කරවීමට උත්සාහ කරන ලදී. සෑම මාසයකම ගොවි සංවිධානය වෙත පැමිණෙන බැංකුවේ නිලධාරි මහතා විසින් ගොවි සංවිධානයේ සාමාජිකයන්ගේ පුද්ගලික ගිණුම්වල මුදල් තැන්පත් කිරීමේ කාර්යයෙහි ඔවුන් යොදවනු ලබයි.

දෙවනුව ගොවි සංවිධානයේ නමින් ද ගොවීන් සියළු දෙනාම එකතු වී පොදු මුදල් තැන්පත් කිරීමක් කරන අතර එහි සාර්ථක ප්‍රතිඵල නෙලාගත් බොහෝ අවස්ථා කුරුණෑගල දිස්ත්‍රික්කය තුලින් මෙන්ම ලංකාවේ වෙනත් දිස්ත්‍රික්කවල ගොවි සංවිධාන ආශ්‍රයෙන් ද දැකිය හැක. නාගොල්ලාගම ගොවි සංවිධානය විසින් කන්නය අවසානයේදී එහි සාමාජිකයන්-ගෙන් වී බුසල බැගින් එකතු කරනු ලබන අතර එම වී සියල්ල විකුණා ලැබෙන මුදල් ගොවි සංවිධානයේ පොදු ඉතුරුම් වලට බැර කරනු දැකිය හැකිය.

සුළුගොවි සංවිධාන ව්‍යාපෘතිය ග්‍රාමීය කෘෂිකර්මාන්තය කෙරෙහි නිලධාරීන්ගේ සහාය වැඩි වැඩියෙන් ලබාගැනීමේ ව්‍යාපෘතියක් වශයෙන් හැඳින්වේ. ගොවි සංවිධාන පිහිටුවීම සඳහා පුහුණු කරවනු ලැබූ නිලධාරීන් මෙන්ම අනිකුත් කෘෂි ක්ෂේත්‍රයට අදාල රජයේ නිලධාරීන්ගේ අනුග්‍රහය ද ගොවීන් වෙත ලැබීම මෙම ව්‍යාපෘතිය ලබාගෙන ඇති තවත් ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. මේ තත්ත්වය කෙරෙහි බලපාන ප්‍රධාන කරුණු දෙකක් මෙහිදී සාකච්ඡා කිරීමට කැමැත්තෙමි. ඉන් පළමුවැන්න නම් ගොවීන් කණ්ඩායමක් වශයෙන් සංවිධානය වී රජයේ නිලධාරීන්ගෙන් යමක් ඉල්ලුම් කරන විට එම ඉල්ලීම පැහැර හැරීමට ඇති ඉඩකඩ අඩුවෙයි. මේ අනුව කණ්ඩායමේ සාමූහික ප්‍රයත්නයට කරන සැලකිල්ලක් වශයෙන් එම සේවා සැපයුම් ලබාදීම සිදුවේ. දෙවන කරුණ නම් ගොවීන් කණ්ඩායමක් වශයෙන් සංවිධානය වීම නිසා සේවා සහ සැපයුම් ලබාදෙන නිලධාරියාට තමන්ගේ කාර්යය මනා අන්දමින් ඉටු කිරීමට සුදුසු වාතාවරණයක් සලස්වයි. මෙහිදී උදාහරණ වශයෙන් කෘෂිකාර්මික දැනුම ලබාදෙන කෘෂි ව්‍යාප්ති සේවක මහතෙකු ගනිමු. ඔහුගේ බල ප්‍රදේශය තුල අඩු තරමින් ඔහුට ගොවීන් 1000 කට නොඅඩු සංඛ්‍යාවකට සේවා සැපයීමේ වගකීම පැවරී ඇත. එහෙත් පුද්ගලිකව මෙම ගොවීන් 1000 හමුවී එම සේවා සැපයීමෙහිලා ඔහුට ඇති ඉඩකඩ සීමා වේ. එහෙත් මෙම ගොවීන් කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී කෘෂිකාර්මික දැනුම ලබාගැනීමට සඳහා සූදානම් වී ඇත්නම් එය පහසුවෙන් ලබාදීමට ඔහුට හැකි වේ.

කුඩා කණ්ඩායමක් වශයෙන් තමන්ගේ ගම තුල හෝ යාය තුල සංවිධානය වූ ගොවීන් ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට අනුව වගකීම් අන්‍යොන්‍යව බෙදා ගෙන කටයුතු කිරීම නිසා එම කාර්යයන්හි ක්‍රමවත් බවක් ඇති කරවන අතරම කණ්ඩායමේ වගකීම් ද බෙදීයාමේ සටරූපයක් නිර්මාණය වේ. සාමාජිකයන් 25 හෝ 30 සිටින ගොවි සංවිධානයක ජලපාලන කටයුතු සඳහා 5 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ද, බැඳුම් හා ඉතිරිකිරීම් කටයුතු සඳහා 5 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ද සේවා සහ පහසුකම් ලබාගැනීම සඳහා 5 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ද ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා 5 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ද වශයෙන් ගොවි සංවිධානයේ වගකීම් බෙදාහදා ගෙන ඉටු කරනු ලැබීම මින් අදහස් වේ.

<u>අත්දැකීම්.</u>

මෙම ව්‍යාපෘතිය තුළින් ලබාගත් අත්දැකීම් විමර්ශනයට ලක් කිරීම තුළින් ව්‍යාපෘතියේ ඉදිරි අනාගතය හෙළිපෙහෙළි කර ගැනීමට හැකිවනු ඇත. නිවැරදි නායකත්වය ගොවි සංවිධානයක ක්‍රියාකාරිත්වය කෙරෙහි බෙහෙවින් බලපාන බව අප ලැබූ වැදගත් අත්දැකීමකි. නායකයාගේ අවශ්‍යතාවයත්, කණ්ඩායමක් හැසිරවීමේ පෞරුෂත්වයත් කණ්ඩායමේ ක්‍රියාකාරිත්වය පැහැදිලිව තීරණය කෙරෙන සාධක වශයෙන් දැක්විය හැක. එහෙත් එම කණ්ඩායමේ නායකයා හට කණ්ඩායමේ සාමාජිකයන්ගේ ආර්ථික මට්ටමෙන් ඉහල තත්ත්වයක සිටී නම්, හොඳ නායකයෙකුගේ ලක්ෂණ ඔහු තුළින් බිහිවීමට ඇති ඉඩකඩ සීමිත වේ. විශේෂයෙන් නායකයා විසින් කණ්ඩායමේ සාමාජිකයන් පාලනය කරනවාට වඩා කණ්ඩායමේ සාමාජිකයන් එක් අරමුණකට ගැනීමත්, එම අරමුණ ලඟාකර ගත හැකි මාර්ග ඔවුන්ට පෙන්වාදීමත් කළයුතු වේ. එවැනි යහපත් නායකත්වයක් නිසා සාර්ථකව ක්‍රියාත්මක වන සුළු ගොවි සංවිධාන දෙකක් ලෙස කිතලව, විරඹුගෙදර පෙන්වා දිය හැක.

නිවැරදි සාමාජිකත්වයක් තුළින් ගොවි සංවිධානය බිහිවීම නිසා එහි සාර්ථකත්වය වැඩි කරවයි. විශේෂයෙන් එකම ආර්ථික, අධ්‍යාපනික හා සමාජීය රටාවක ජීවත්වන පුද්ගලයන් කොටසක් කණ්ඩායමක් වශයෙන් සංවිධානය වීමෙන් ලැබෙන ප්‍රතිඵල විශාලය. එයට හේතුව ඔවුන් සියළුදෙනා තුල සමාන අරමුණු, පරමාර්ථ සහ බලාපොරොත්තු තිබීමයි. මෙවැනි සාමාජිකත්වයක් පදනම් කරගෙන සංවිධානයක් ඇති කිරීම සඳහා ප්‍රදේශ සමීක්ෂණයක් මෙන්ම ගෘහමූලික සමීක්ෂණයන් ද පවත්වනු ලැබීය. එමගින් ගොවීන්ගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතිකමය ලක්ෂණ ගැන නිවැරදි අදහසක් ඇති කර ගත හැකිය. විශේෂයෙන් සුළු ගොවීන්ට පමණක් ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා දීම ඉතා වැදගත් වෙයි. එසේ නොවූ විට ගමෙහි ඉඩම් හිමියන් හා දේශපාලනික වශයෙන් හෝ අධ්‍යාපනික වශයෙන් බලගතු අයවලුන් විසින් සංවිධානයේ නායකත්වය පැහැර ගනු ලැබීමට ඉඩ සැලසේ.

කණ්ඩායම තුල අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රමවත් වැඩ පිළිවෙලක් තිබීම ද එහි සාර්ථක පැවැත්ම කෙරෙහි අතිශයින්ම බලපායි. බොහෝ සංවිධාන මාසයකට වරක් රැස්වීම් පැවැත්-වුවද ඔවුන්ට ක්‍රියාත්මක කළහැකි ඉතිරි ක්‍රියාමාර්ගයන් නැත. මේ තුළින් සිදුවන්නේ සාමාජික-යන්ගේ සහභාගිත්වය ගොවි සංවිධානයෙන් ඉවත්වීමයි. අඩු තරමින් සෑම මාසයකට වරක්ම ගොවි සංවිධානය රැස්විය යුතුය. එසේ රැස්වන කණ්ඩායම විසින් එම මාසය තුල කිරීමට බලාපොරොත්තු වන වැඩ කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම, ඒ අනුව තීරණ ගැනීම හා ඒවා ඉටුකරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අතිශයින් වැදගත් ය. ඊලඟ මාසයේ දී රැස්වන එම කණ්ඩායම පසුගිය මාසයේදී ගනු ලැබූ තීරණ කොතෙක්දුරට ඉටුවී ඇද්දැයි

පසු විපරම් කිරීම, ක්‍රියාකාරකම් අගය කිරීම හා ඉටුවී නොමැති අරමුණු ඉටුකර ගැනීමෙන් විය හැකි වාසි සෙවීම අතිශයින් වැදගත් ය. මෙවැනි තත්ත්වයන් ඇතිවීමෙන් කණ්ඩායමේ සාමාජිකයන් තුල ගොවි සංවිධානය පිළිබඳව පැහැදිලි විශ්වාසයක් ඇති වෙයි.

කණ්ඩායමේ සියලු දෙනා විසින්ම පසක් කරගනු ලැබූ ප්‍රශ්න එකත් හෝ රට වැඩි ගණනක් තිබීම ද කණ්ඩායමේ සාර්ථකත්වය කෙරෙහි අතිශයින්ම බලපායි. උදාහරණ වශයෙන් සංවිධානයේ සියලු දෙනාටම පොදුවූ ප්‍රශ්නය ජල ප්‍රශ්නය විය හැක. ඒ අවස්ථාවේ දී සියලු දෙනාම එම ප්‍රශ්නය පසක් කරගෙන එය තමන්ගේ ප්‍රශ්නයක් බවට පත්කර ගතයුතුය. අනතුරුව එය විසඳිය හැකි මාර්ග පිළිබඳව අවබෝධයක් ලබාගත යුතු අතර කණ්ඩායමේ සාමූහික ප්‍රයත්නය තුලින් එය විසඳා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් කළයුතුය. උදාහරණ වශයෙන් කුඩා ගල්ගමුව ගොවි සංවිධානයේ ගොවීන් සියලුදෙනාම මුහුණපා ඇති වැදගත් ප්‍රශ්නය නම් තමන් වගා කරන ඉඩම්වල සුරක්ෂිත භාවයක් නැතිකමයි. මේ නිසාම බැංකු වලින් ණය ගැනීම, තමන්ගේ කුඹුරු රක්ෂණය කර ගැනීම ආදී රජය මගින් සපයන නීත්‍යානුකූල සේවා කිසිවක් ලබාගැනීමට ඔවුන්ට නොහැකිය. මේ කරුණු සියල්ල ඉතා හොඳින් පසක් කරගත් මේ පිරිස තමන්ගේ ඉඩකඩම්වල නීත්‍යානුකූල භාවය ඇති කරගැනීම සඳහා සාමූහික ප්‍රයත්නයක යෙදේ.

කෘෂි ක්ෂේත්‍රයෙහි කටයුතු කරන රජයේ නිලධාරීන්ගේ අනුග්‍රහය ව්‍යාපෘතිය වෙත වැඩි වැඩියෙන් ලබාදීම ඉතා වැදගත් ය. මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව වශයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කටයුතු කළ ද, එය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද සංවිධාන ක්‍රමයක් වශයෙන් අනිකුත් බොහෝ දෙපාර්තමේන්තු කල්පනා කිරීමට නැඹුරු වී ඇත. මෙය දුර්මතයකි. සුළු ගොවි සංවිධාන ගොවීන්ගේම සංවිධාන ක්‍රමයකි. ඒ සඳහා සියලුම රජයේ නිලධාරීන්ගේ අනුග්‍රහය අතිශයින්ම වැදගත් වෙයි.

<u>ගැටලු.</u>

ග්‍රාමීය ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන සුළුගොවි සංවිධාන ව්‍යාපෘතියක ක්‍රියාකාරකම් අඩපණ කරන විවිධ සාධක ගම තුල මෙන්ම ගමෙන් පරිබාහිරව ද ඇතිය හැකිය. ශ්‍රී ලංකාවේ බොහෝ ගම් දේශපාලනික වශයෙන් භේදභින්න වී කටයුතු කිරීම මෙම ව්‍යාපෘතිය වෙත බලපාන ප්‍රශ්නයක් වශයෙන් පෙන්වා දිය හැක. දේශපාලනික වශයෙන් විරුද්ධ පක්ෂයක කටයුතු කරන පිරිසක් මෙවැනි සංවිධානයකට එක්වීම ප්‍රතික්ෂේප කළහැක.

එහි ක්‍රියාකාරකම් ද බොහෝ විට විවේචනයට ලක් කිරීමට උත්සාහ ගැනීමට ඉඩ ඇත. මීට අමතරව ගම තුළ සාමාජීය වශයෙන් පුද්ගලයින් අතර දැකිය හැකි විවිධ භේදභින්නතා ගම තුළ ඇති විසංවිධිතකාරී සවරූපයට ප්‍රධාන හේතුවක් වේ. මෙම ලක්ෂණ සුළු ගොවි ව්‍යාපෘතිය කෙරෙහි බාධා පමුණුවන ගැටළු වශයෙන් පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ බොහෝ ගම්වල වැසියෝ ගැමි ස්වේච්ඡා සංවිධාන පිළිබඳව දක්වන ආකල්පය ද මෙවැනි ව්‍යාපෘතියක උන්නතිය කෙරෙහි විශේෂයෙන් බලපායි. රජය මගින් මෙන්ම ස්වේච්ඡා සංවිධාන මගින් ලංකාවේ ගම් වෙත හඳුන්වා දී ඇති ස්වේච්ඡා සංවිධාන සංඛ්‍යා ඉතා විශාලය. ඒවායේ අසාර්ථකත්වය සුළු ගොවි සංවිධාන සම්බන්ධයෙන් ද ගැමියන්ගේ සැක ඇති කිරීමට තුඩු දේ. ලංකාවේ මෙතෙක් ක්‍රියාත්මක වූ එම සංවිධාන කෙරෙහි නායකත්වය ගෙන කටයුතු කර ඇත්තේ ගැමියන්ගේ වචනයෙන් හැඳින්වෙන දේශපාලනික වශයෙන්, ඉඩම් හිමි බවින්, මුදල්මය හා අධ්‍යාපනික වශයෙන් කිසියම් වත්පොහොසත්කමක් ඇති "වැදගත්" යයි සම්මත පවුල්වල පුද්ගලයන්ය. මෙම වැදගත් පිරිසගේ අරමුණු හා පරමාර්ථ ගැමි සුළු ගොවීන්ගේ අරමුණු හා පරමාර්ථත් අතර දක්නට ලැබෙන්නේ පරස්පර විරෝධී බවකි. මෙම තත්ත්වය හේතුකොට ගෙන එම ස්වේච්ඡා සංවිධානවල ගැමි සහභාගිත්වය ඉවත් වූ විට ටික කලෙකින් එම සංවිධාන කඩාකප්පල් වී යාම ද සුලභ දර්ශනයකි. මෙම අයහපත් අත්දැකීම් රටාව සුළු ගොවි සංවිධාන වෙත ගැමි සහභාගිත්වය ලබාදීමෙහිලා විශේෂ ගැටළුවක් ලෙස ක්‍රියාත්මක වන බව පෙනේ.

ගොවි සංවිධානයේ නායකයා වශයෙන් හෝ සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් කටයුතු කරන ගොවි නියෝජිතයාගේ හැසිරීම හා විශ්වාසය සමහර විට ගොවි සංවිධාන වෙත අයහපත් අන්දමින් බලපායි. ගොවිජන සේවා පනත මගින් බිහිවූ ගොවි නියෝජිතයාගේ තනතුරත් පැරණි වෙල්විදානේ තනතුරත් අතර ඇත්තේ පරස්පර විරෝධිතා වයකි. පැරණි වෙල්විදානේ ක්‍රමය වැඩවසම් සමාජයේ සමාජ තත්ත්වය විසින් උරුම කර දෙන්නක් වූ අතර ඔහුගේ එම තත්ත්වය කෙරෙහි බලපාන ගම තුළ ඔහුට තිබුණ "වැදගත්කම", ඉඩම් හිමි බව, වත්පොහොසත්කම ආදිය ද සාධක විය. එහෙත් ගොවි නියෝජිතයා ගොවීන්ගේ ඡන්දයෙන් පත්වූ නායකයෙකු වුවද ඔහුට මෙවැනි ව්‍යාපෘතියක සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් කටයුතු කිරීම දුෂ්කර වේ. ඉඩම් හිමිබව, අධ්‍යාපනික වශයෙන් පොහොසත් බව හා දේශපාලනික වශයෝ බලගතුකම ඇති ගම් වැසියන්ගේ බලපෑම් නවතා සුළු ගොවීන් ආරක්ෂා කර ගැනීමේ හැකියාවක් ගොවි නියෝජිතයා තුළ තිබිය නොහැක.

විශේෂයෙන් පැරණි වෙල්විදානේ ක්‍රමය තුළ වෙල්විදානේ සතුව තිබූ සමාජ ගරු බුහුමන් ගොවි නියෝජිතයා භුක්ති නොවිඳී. මේ නිසා ඔවුහු එක අතකින් පසුතැවිලි වන අතර පැරණි නායකත්වයේදී මෙන් නීතිමය බලයක් තමන් වෙත නොමැතිකම ගැන ද කණගාටු වෙති.

මෙම දුක් ගැනවිල්ල එක් අතකින් තමන්ගේ ප්‍රදේශයේ ගොවීන්ගේ ඡන්දයෙන් පත්වූ නායකයෙකු බව අමතක කිරීමට තුඩු දෙන්නකි. අනික් අතට නීතිමය බලයක් නොමැතිකම නිසා ඔහුගේ රාජකාරි කටයුතු නියමාකාර අන්දමින් ඉටු කිරීමට බාධා ඇතිවෙයි.

ගොවීන්ගේ පාරම්පරික අදහස් උදහස් හා ආකල්ප රටාව ද සුළු ගොවි සංවිධාන කෙරෙහි බලපාන බව පෙන්වා දිය හැක. එමෙන්ම ගොවීන් විසින් නිරන්තරයෙන්ම රජය විවේචනය කරනු ලැබීම රජයේ ප්‍රතිපත්ති විවේචනය කරනු ලැබීම, නිලධාරීන් දෙස ද්වේෂ සහගතව බලනු ලැබීම මෙම ව්‍යාපෘතියේ උන්නතියට බාධා පමුණුවන ගැටළු වශයෙන් පෙන්වා දිය හැක.

<u>ව්‍යාපෘතිය පිළිබඳව ඉදිරිපත් කළ හැකි යෝජනා:</u>

* සුළුගොවි සංවිධානවල ලියාපදිංචි කිරීමක් අවශ්‍ය බව ක්ෂේත්‍ර මට්ටමේදී බොහෝ ගොවීන්ගෙන් නැගුනු යෝජනාවකි. විශේෂයෙන් බැංකු ණය, කෘෂි රක්ෂණ වන්දි, කණ්ඩායමක් වශයෙන් ලබාගැනීමේ කටයුතු සඳහා ග්‍රාමීය මට්ටමේ නීත්‍යානුකූල සමිතියක් වශයෙන් මෙම ගොවි සංවිධාන පිළිගැනීමේ වැදගත්කම අවධාරණය කළහැක. එහෙත් ග්‍රාමීය මට්ටමේ අඛණ්ඩව පවත්වාගෙන ඇති මරණාධාර සමිතිය කුමන ආයතනයක හෝ ලියාපදිංචි වී නැතත් එහි ක්‍රියාකාරිත්වයේ පැහැදිලි බවක් පෙන්නුම් කරයි. සමිතියක් ලියාපදිංචි කිරීම තුළින්ම එහි ක්‍රියාකාරිත්වය සහතික නොවේ. ක්‍රියාකාරිත්වය මනාව සිදුවේ නම් එම සුළු ගොවි සංවිධාන ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කිරීම සුදුසු ය.

* ග්‍රාමෝදය මණ්ඩලය ග්‍රාමීය මට්ටම තුල සකස් වී ඇත්තේ ගම තුල දක්නට ලැබෙන ස්වේච්ඡා සංවිධානවල එක්තරා පොදු නියෝජනවීමක් වශයෙනි. විශේෂයෙන් මේ රජය විසින් ග්‍රාමෝදය මණ්ඩල පිහිටුවා ඇත්තේ ගමේ සියළු දියුණුව ලබාගත හැකි එක්තරා සංවිධාන ක්‍රමයක් වශයෙනි. මේ අනුව සුළු ගොවි සංවිධානවල නායකයන්ට ද ග්‍රාමෝදය මණ්ඩලයට ඇතුළුවීමේ වරප්‍රසාද ඇති කරදෙන මෙන් බොහෝ ගොවිසංවිධාන විසින් යෝජනා කරන ලදි. මෙහිදී ද යෝජනා කළයුතු වැදගත් කරුණක් ඇත. ක්‍රියාකාරී ගොවි සංවිධානයක් ග්‍රාමෝදය මණ්ඩලය වැනි පොදු සංවිධානයක සාමාජිකත්වය ලැබීම මනාය. එහෙත් ග්‍රාමෝදය මණ්ඩලයට ඇතුල්වීමේ හුදු පරමාර්ථය මුල් කරගෙන බොහෝ පිරිස් විසින් ගොවි සංවිධාන පිහිටුවීමට උත්සාහ කරති. එහිදී ඔවුන් ගොවි සංවිධානයේ වැදගත්කම, පරමාර්ථ පිළිබඳව දක්වන සැලකිල්ල හීන කරයි. ගොවි සංවිධාන සම්බන්ධයෙන් ඉදිරියේදී වගකිව යුතු කණ්ඩායම් මේ තත්ත්වය සැලකිලිමත්ව තේරුම් ගෙන ක්‍රියාකාරී ගොවි සංවිධාන වලට පමණක් ග්‍රාමෝදය මණ්ඩලය නියෝජනය කිරීමේ වරප්‍රසාදය ලබාදීම වැදගත් ය.

* ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙහි ඇති ඉහිරි යාය ප්‍රදේශවල ද ගොවි සංවිධාන ආරම්භ කළයුතු වේ. එසේ ගොවි සංවිධාන ආරම්භ කිරීමෙන් ගොවි සංවිධාන අතර අන්තර් සම්බන්ධීකරණ රාමුවක් ගොඩ නැගේ. එසේ නොමැති වූ විට දැනට එක් ගොවිජන සේවා කමිටු ප්‍රදේශයක ගොඩනගා ඇති ගොවි සංවිධාන 02 කට පමණක් හුදෙකලාව නැගී සිටීමේ වාතාවරණය අඩු වේ. විශේෂයෙන් කෘෂි නිෂ්පාදන අලෙවිය සම්බන්ධ කටයුතු වලදී ගොවි සංවිධාන රාශියක සාමූහික ක්‍රියාකාරීත්වය තුලින් ලැබෙන ප්‍රතිඵල වැඩි වාසි ගෙන දේ.

* එක් ගොවිජන සේවා කමිටු ප්‍රදේශයක ගොඩනැගෙන ගොවි සංවිධාන තුලින් ප්‍රාදේශීය මට්ටමේ ගොවි සංවිධාන කාර්යාංශයක් ඇති කිරීම වැදගත් වේ. උදාහරණයක් වශයෙන් එක වගා නිලධාරි කොට්ඨාශයක ගොවි සංවිධාන පහක් බිහි වෙතැයි සිතමු. එවිට එක් එක් ව.නි.කො. නියෝජනය කරන නියෝජිතයන් 5 දෙනා මෙම ගොවි සංවිධාන කාර්යාංශයට පත්විය යුතුය. තවද ප්‍රාදේශීය මට්ටමේදී කෘෂි ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම රජයේ නිලධාරීන් ද මෙම ගොවි සංවිධාන කාර්යාංශයේ සාමාජිකයන් විය යුතු බව යෝජනා කරමු.

* ගොවිජන සේවා කමිටු බල ප්‍රදේශයෙහි ගොවි සංවිධාන සම්බන්ධ ප්‍රශ්න ඉහත සඳහන් ගොවි සංවිධාන කාර්යාංශ මගින් සාකච්ඡා කරන අතර, ප්‍රාදේශීය මට්ටමින් විසඳිය නොහැකි ප්‍රශ්න වලට විසඳුම් සෙවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් ගොවි සංවිධාන කාර්යාංශයක් ඇති කළ යුතුය. එක් එක් ප්‍රාදේශීය ගොවිජන සේවා කමිටු ප්‍රදේශයෙන් මෙම දිස්ත්‍රික් කාර්යාංශය වෙත එක් ගොවියෙකු බැගින් පත්විය යුතු අතර, ඊට අමතරව කෘෂි ක්ෂේත්‍රයට අදාල සියළුම දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් ද මෙම දිස්ත්‍රික් ගොවි සංවිධාන කාර්යාංශයට සම්බන්ධ විය යුතුය.

* මීට අමතරව දිස්ත්‍රික් ගොවි සංවිධාන කාර්යාංශයේදී සාකච්ඡා කොට විසඳුම් ලබාගත නොහැකි ප්‍රශ්න විසඳීම සඳහා ජාතික ගොවි සංවිධාන කාර්යාංශයක් ඇති කිරීමේ වැදගත්කම මෙහිදී යෝජනා කිරීමට කැමැත්තෙමු. ගොවීන් කොතරම් සංවිධානය වී තමන්ගේ සාධාරණ ඉල්ලීම් ලබාගැනීමට කටයුතු කලත් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන උදවිය වෙත එම ඉල්ලීම් ඉදිරිපත් කිරීමට සුදුසු මාර්ගයක් නැත්නම් ගොවීන් තළකිරෙනු ඇත. මේ තත්ත්ය සැලකිල්ලට ගැනීමේදී ජාතික මට්ටමින් ද ගොවි සංවිධාන කාර්යයන් ඇතිකිරීමේ වැදගත්කම තැපී පෙනේ. මෙම ගොවි සංවිධාන කාර්යාංශයට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, කෘෂි සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, සත්ව පාලනය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ආදී වශයෙන් ජාතික මට්ටමේ නිලධාරීන්ගේ නියෝජනයක් සිදුවිය යුතුය.

ගැමි කෘෂිකර්මාන්තය නගා සිටුවීමේ ප්‍රයත්නයේදී සුළුගොවි සංවිධාන ව්‍යාපෘතියෙන් ගත හැකි අත්දැකීම් රාශියකි. විශේෂයෙන් තමන්ගේ කෘෂිකාර්මික ගැටළුවලට හා ඒ සම්බන්ධව බලපාන අභියෝගයන්ට මුහුණදීමට ගොවියන්ට හුදකලාව නොහැකි බව ඔප්පු වී හමාරය. එසේ නම් ගොවියාගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා මනාව සංවිධානය වූ ගොවි සංවිධාන රටාවක අවශ්‍යතාවය කැපී පෙනේ. ජලපාලනය, පොහොර භාවිතය, නවීන කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම උපයෝගී කරගැනීම මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී අවශ්‍ය කරන සන්නිවේදනය, නිලධාරීන් අතර සමඟිය හා නිලධාරීන් හා ගොවීන් අතර සමඟිය ද ඉතා වැදගත් ය. මෙවැනි සන්නිවේදනයන් ඇති කළහැකි එක් මාධ්‍යයක් ලෙස මෙම සුළු පරිමාණ ගොවි සංවිධාන ව්‍යාපෘතිය හැඳින්විය හැක. මෙම ව්‍යාපෘතිය පළමු පියවරේදී ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශය හා ගල්ගමුව ඡන්ද කොට්ඨාශය වෙත හඳුන්වා දෙන ලදී. එහි දෙවන හා තුන්වන පියවරේදී පිළිවෙලින් කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාත් ශ්‍රී ලංකාවේ ඉතිරි දිස්ත්‍රික්ක වෙතත් ව්‍යාප්ත කිරීමේ කටයුතු දැනට සම්පූර්ණ කොට ඇත.

------ නිමි ------

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කමිටු පදනම යටතේ ගොවි සංවිධාන ව්‍යාප්තිය.

ගොවිජන සේවා මධ්‍යස්ථානය.


1. කොබෙයිගනෙ
2. නිකවැරටිය
3. පහල මාවතගම
4. කොටවෙහෙර
5. වාරියපොල
6. මාහෝ
7. අඹන්පොල
8. නාගොල්ලාගම
9. පඬුවස්නුවර
10. මුරුතළ්දෙණිය
11. බිංගිරිය
12. අවුලේගම
13. පොතුහැර
14. කුරුණෑගල
15. වීරඹුගෙදර
16. වැල්ලව
17. රඹේ
18. දුම්මලසූරිය
19. උඩුබද්දාව
20. ගමන්ගල්ල
21. වෙල්පල්ල
22. යක්විල
23. කුලියාපිටිය
24. දීගල්ල
25. වැටගම
26. කිතලව
27. හොරොම්බාව
28. කුඩාගල්ගමුව
29. මාවතගම
30. වේරවැල්ල

31. රම්බොඩගල්ල
32. බෝයිගනේ
33. තාරණ
34. පොල්ගහවෙල
35. මහාරච්චිමුල්ල
36. නාරම්මල
37. මැල්සිරිපුර
38. ඉබ්බාගමුව
39. ඇහැටුවැව
40. මොරගොල්ලාගම
41. ගල්ගමුව
42. මහානාන්නේරිය
43. රාජාංගනය (වම් ඉවුර)
44. කුඹුක්ගැටේ
45. කරඳගොල්ල
46. කනෝගම
47. දොඩන්ගස්ලන්ද
48. මඩහපොල
49. දඹදෙණිය
50. අලව්ව
51. හුලුගල්ල

## කුරුණෑගල දිස්ත්‍රික්කය

## ගොවිජන සේවා කමිටු පදනම යටතේ


## සුළුගොවි සංවිධාන ව්‍යාප්තිය.



# ශ්‍රී ලංකාව

## දිස්ත්‍රික් පදනම යටතේ

## සුළුගොවි සංවිධාන ව්‍යාප්තිය.



## ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් පදනම යටතේ ගොවි සංවිධාන ව්‍යාප්තිය.

| දිස්ත්‍රික්කය | ගොවිජන සේවා මධ්‍යස්ථානය |
|---|---|
| 1. අනුරාධපුරය | 1. මිහින්තලේ |
| 2. මාතලේ | 2. හිඹිස්ස |
| 3. ගාල්ල | 3. පිලාන |
| 4. මාතර | 4. දෙපියන්දර |
| 5. අම්පාර | 5. නාමල්තලාව |
| 6. කෑගල්ල | 6. බැම්මිවත්ත |
| 7. මහනුවර | 7. ඉඹුල්දෙනිය |
| 8. නුවරඑළිය | 8. බුලුගහපිටිය |
| 9. බදුල්ල | 9. යටිපලාන |
| 10. රත්නපුරය | 10. ඇහැලියගොඩ |
| 11. පුත්තලම | 11. නවගත්තේගම |
| 12. මාදම්පේ | 12. මුන්නේස්වරම් |
| 13. ත්‍රිකුණාමලය | 13. අග්බෝපුර |
| 14. කොළඹ | 14. වෑහර |
| 15. කළුතර | 15. දොඩන්ගොඩ |
| 16. හම්බන්තොට | 16. බෙලිඅත්ත |
| 17. මොණරාගල | 17. බඩල්කුඹුර |
| 18. ගම්පහ | 18. මීරිගම |
| 19. පොළොන්නරුව | 19. සේවාගම |